සභාපති / ප්‍රධාන විධායකගේ පණිවිඩය

# Visionary



**හේලීස් ලෝකය තුළ ඇති උසස්ම ශක්තිය වන්නේ එහි විවිධත්වය, ආයතනික පාලන ව්‍යුහය හා සහජීවනය තුළින ඵලදායීතාවය උත්පාදනය කිරීමට ඇති හැකියාවයි. විවිධත්වය විවිධ ස්වරූපයන් ගන්නා අතර අතර එය කර්මාන්ත හා රටවල් තුළින් පෙනෙන විවිධත්වය ඉක්මවා එහි සංස්කෘතිකමය හා ප්‍රජා විවිධත්වය දක්වා විහිදේ.**

**මොහාන් පණ්ඩිතගේ**
සභාපති සහ ප්‍රධාන විධායක

හිතවත් කොටස් හිමියනි,

වසර 144 ක ඉතිහාසය තුළ නව වාර්තාවක් සනිටුහන් කරමින් මෙතෙක් වාර්තා කළ ඉහළම ලාභය ලෙස පෙර වර්ෂයට සාපේක්ෂව 100% වර්ධනයක් සහිතව හේලීස් සමූහය විසින් වර්ෂය සඳහා රු. බිලියන 28.10 ලාභයක් ඉපයීමට සමත්ව ඇති බව සතුටින් සඳහන් කරමි. මුහුණ දුන් අභියෝග ජයගැනීම සඳහා සහ අනතුරුදායක තත්ත්වයන් කල් තියා හඳුනාගැනීමට අපට සමූහයක් වශයෙන් මෙම වසර තුළ නව වැඩසටහන් ඉදිරිපත් කිරීමට හැකි විය. එතුළින් වසරක් තුළ වේගවත් ප්‍රගතියක් අත්පත් කරගැනීමට හේලීස් ලෝකයේ සාමාජිකයින් වන අපහට හැකිවිය.

නිදහසින් පසුව මුහුණ දෙන දරුණුතම සමාජ ආර්ථික අර්බුදයකට මුහුණ දෙමින් සිටින ශ්‍රී ලංකාව මෙම සමාලෝචනය ලියමින් සිටින මොහොත වන විට එම අර්බුදකාරී තත්ත්වය සමනය කරගත හැකි මාවතකට යොමු වෙමින් පවතින බව දැකගත හැකිය. රටෙහි භාවිතා කළ හැකි විදේශ ව්‍යවහාර මුදල් සංචිත පහළ වැටී ඇති අතර 2022 වසරේ මාර්තු - අප්‍රේල් කාලය තුළ ශ්‍රී ලංකා රුපියල ඇමරිකානු ඩොලරයට සාපේක්ෂව 75% කින් අවප්‍රමාණය වී ඇත. එමෙන්ම 2022 අප්‍රේල් මාසය වන විට උද්ධමනය 30% ක මට්ටමකට ළඟාවී ඇති අතර ඉතිහාසයේ පළමු වතාවට රටෙහි ණය නැවත ගෙවීමේ දුෂ්කරතාවයකට මුහුණ දී ඇත. ආර්ථිකය නැවත සමබර කිරීම සඳහා අවශ්‍ය ප්‍රතිසංස්කරණ සහ නිවැරැදි කිරීම් සිදුවනු දක්නට ලැබෙන අතර වඩාත් නිවැරදි ක්‍රියාමාර්ග යක් ලෙස ප්‍රතිපත්ති පොලී අනුපාත 2022 අප්‍රේල් මාසයේදී පදනම් අංක 700 කින් ඉහළ දමා ඇත. අත්‍යවශ්‍ය භාණ්ඩවල හිඟය සහ උද්ධමනය හේතුවෙන් ජනතාව මුහුණ පා ඇති ආර්ථික දුෂ්කරතාව ඉතා ඉක්මණින් විසඳා ගත යුතු වැදගත් කරුණකි. මේ අතරතුර, අප හට පැහැදිලි ඉදිරි ගමනක් හිමිවන තුරු විදේශ විනිමය ඉපයීම සහ රැකියාවන් හා ජීවනෝපායන් ආරක්ෂා කිරීම වෙනුවෙන් ආර්ථිකය මෙහෙයවීම අත්‍යවශ්‍ය කරුණකි.

### විවිධත්වය, පාලනය හා සහජීවනය

හේලීස් ලෝකය තුළ ඇති උසස්ම ශක්තිය වන්නේ එහි විවිධත්වය, ආයතනික පාලන ව්‍යුහය හා සහජීවනය තුළින් ඵලදායීතාවය උත්පාදනය කිරීමට ඇති හැකියාවයි. විවිධත්වය විවිධ ස්වරූපයන් ගන්නා අතර අතර එය කර්මාන්ත හා රටවල් තුළින් පෙනෙන විවිධත්වය ඉක්මවා එහි සංස්කෘතිකමය හා ප්‍රජා විවිධත්වය දක්වා විහිදේ. අපගේ ලෝකය දියුණු පරිසර පද්ධතියකි. එහි වැඩ කරන්නන්, විද්‍යාඥයින්, තාක්ෂණවේදීන් සහ ප්‍රායෝගික දැක්මක් සහිත විද්වතුන් යන සියළු දෙනාම පොදු අරමුණු සහ වටිනාකම් සැලකිල්ලට ගනිමින් අපගේ උපායමාර්ගික අරමුණ ළඟාකර ගැනීම සඳහා එක්ව වැඩ කරති. හේලීස් සමූහයේ පරිපාලන යාන්ත්‍රණය එකමුතුභාවයට පහසුකම් සලසන අතර නිර්ණය කළ සීමාවන් තුළ පොදු ඉලක්ක වෙත රැගෙන යයි. අපගේ ව්‍යපාර සමූහය තුළ මානව සම්පත හඳුනාගැනීම, අගය කිරීම සහ කාර්යසාධන ප්‍රතිලාභ කිසිඳු භේදයකින් තොරව ලබාදීම සඳහා වූ සංස්කෘතියකින් පෝෂණය වී ඇත.

**සාරාංශය - 2021/22**

විදේශ විනිමය ඉපයීම්
**ඇ.ඩො මිලියන 615.98**

විදේශීය පරිපාලිත සමාගම් වලින් ලද ලාභාංශ
**ඇ.ඩො මිලියන 6.24**

**සුවිශේෂී කාර්ය සාධනය**

විකුණුම් ආදායම ඇ.ඩො බිලියන 1.60 ▲ 25%

පොළී, බදු, ක්ෂය හා ක්‍රමක්ෂය පෙර පොළී හා බදු පෙර ලාභය ඇ.ඩෙ මිලියන 159.35 ▲ 27%

පොළී හා බදු පෙර ලාභය ඇ.ඩො මිලියන 159.35 ▲ 29%

බදු පෙර ලාභය ඇ.ඩො මිලියන 169.42 ▲ 86%

බදු පසු ලාභය ඇ.ඩො මිලියන 133.28 ▲ 100%

**ශක්තිමත් පදනම්**

මුළු වත්කම් ඇ.ඩො බිලියන 1.37

දේපළ පිරියත හා උපකරණ ඇ.ඩො මිලියන 378.36

ප්‍රාග්ධන වියදම් ඇ.ඩො මිලියන 66.58

ජංගම වත්කම් ඇ.ඩො මිලියන 828.17

හිමිකම ඇ.ඩො මිලියන 358.27

ණය ඇ.ඩො මිලියන 585.06

හේලීස් සමූහයේ සහජීවනය තුළින් ඵලදායීතාවය නිර්මාණය කරන ප්‍රධාන සාධකයක් ලෙස පරිපාලනය හඳුනාගත හැකි අතර එය අවදානම් කළමනාකරණයට හා උපායමාර්ග මත ප්‍රතිඵල අත්කර ගැනීමට අත්‍යවශ්‍ය සාධකයක් වේ. ආංශික මට්ටමේ විධායක කමිටුවල සිට සමූහ කළමනාකරණ කමිටුව, අධ්‍යක්ෂ මණ්ඩල කමිටු සහ අධ්‍යක්ෂ මණ්ඩලය දක්වා වූ විවිධ මට්ටමේ සමාලෝචන තුළින් ඉහළ ගණයේ නිරීක්ෂණ සහ අධීක්ෂණ සහතික කරනු ලබයි. සමූහ කළමනාකරණ කමිටුව තුළ ඇති සාමූහික දක්ෂතා, දැනුම සහ දෘෂ්ටීන් මඟින් අපහට අභියෝගාත්මක තත්ත්වයන් කල් තියා හඳුනාග ැනීමටද, ඒ අනුව අවදානම් මනා ලෙස කළමනාකරණයට සහ උපාය මාර්ගික ප්‍රතිචාර දැක්වීමටද හැකියාව ලැබේ. සමූහ කළමනාකරණ කමිටුව සෑම සතියකට වරක්ම සහ අවශ්‍යතාවය මත කෙටි දැනුම් දීමකින් වුවද රැස්වන බැවින් කාලෝචිත ප්‍රතිචාරයන් දැක්වීමට සමත් වේ.

මෙවැනි අවිනිශ්චිත කාලයක් තුළ මෙම රැස්වීම්, සමූහයේ අභිවෘද්ධිය සඳහා හේතු සාධක වී ඇත. නම්‍යශීලී උපායමාර්ග තුළින් සම්පත් ඵලදායී ලෙස භාවිතා කරගැනීමටද අප කටයුතු කරමින් සිටී.

පසුගිය වසරේ පිහිටුවන ලද හේලීස් සමූහයේ ප්‍රවාහන කළමනාකරණ කාර්ය සාධන බලකාය මගින් අපගේ නිෂ්පාදිත නිසි කලට නැව් ගත කිරීම සඳහා වැදගත් කාර්ය භාරයක් ඉටු කරනු ලැබීය. එසේම සමූහ මානව සම්පත් ප්‍රධානී, හේලීස් ඇවෙන්චුරා ප්‍රධානී සහ සියලුම අංශයන්හි මානව සම්පත් ප්‍රධානීන්ගෙන් සැදුම්ලත් කොවිඩ් කාර්ය සාධන බලකාය විසින් අපගේ ව්‍යාපාරික ස්ථානවල සෞඛ්‍ය සහ ආරක්ෂාව සහතික කිරීම මෙන්ම කොවිඩ් රෝගය වැලඳුනු අයගේ රැකවරණය සහතික කිරීමෙන් වැදගත් භූමිකාවක් ඉෂ්ඨ කළහ. කොවිඩ් කාර්ය සාධන බලකාය විසින් අපගේ සේවකයින් හට කොවිඩ් එන්නත් ලබා දීමේ වැඩසටහනක් සංවිධානය කළ අතර දෙවන මාත්‍රාව ලබා දීමේ ප්‍රතිශතය 99% ක් විය. උපායමාර්ගික සැලසුම්කරණ, මූල්‍ය හා භාණ්ඩාගාර වැනි අනෙකුත් කේන්ද්‍රීය අංශයන් විසින් කොවිඩ් කාර්ය සාධනය වෙනුවෙන් අඛණ්ඩව සම්පත් කළමනාකරණයට පහසුකම් සලසන ලදී.

2019 පාස්කු ඉරු දින බෝම්බ ප්‍රහාරයෙන් පසුව අප ලබාගත් අත්දැකීම් දෙස බලන විට එය අපගේ නායකත්ව කණ්ඩායම තුළ ඇති දැනුම සහ පළපුරුද්ද නව මානයක් දක්වා වර්ධනය වී ඇති බවට කදිම සාක්ෂිකයක් සපයනු ලබයි. සාර්ථකත්වයේ මූලික නියමුවන් වන විවිධ අංශයන්හි ඇති කණ්ඩායම් සමූහයේ වර්ධනය නව අදියරකට රැගෙන යාමට අප සමත්ව ඇත.

### පාරිසරික, සමාජ හා ආයතනික පාලනය සඳහා වූ අපගේ කැපවීම

තිරසාරත්වයේ සමාරම්භක විශිෂ්ටයකු වන හේලීස් සමූහය, සමාජයට සහ පරිසරයට වන අහිතකර බලපෑම් අවම කිරීමේ අරමුණින් එහි ඇති බලපෑම අවබෝධ කර ගැනීම වෙනුවෙන් වැඩපිළිවෙලක් සකස් කොට ඇත. මෙම වැඩපිළිවෙල සමූහයේ පාරිසරික, සමාජ හා ආයතනික පාලන තන්ත්‍රය ඉහළ නැංවීමට සහ සෑම අංශයක්ම පොදු ඉලක්කයන් අනුව කටයුතු කරන බවට සහතික කිරීම සඳහා සකස් කර ඇත. අප අපගේ පාරිසරික, සමාජ හා ආයතනික පාලන ප්‍රතිපත්ති හා ඒ සඳහා වන කැපවීම හේලීස් ලයිෆ් කෝඩ් නමින් වන ලේඛනයක් තුළින් එළිදැක්වීමට කටයුතු කරන ලදී. 2030 වර්ෂය වන විට හරිතාගාර වායු විමෝචනය 30% කින් අඩු කිරීම, හේලීස් සමූහයේ භාවිත බිම් ප්‍රමාණය මෙන් පස් ගුණයකින් ජෛව විවිධත්වය ඉහළ දැමීම, 2030 වර්ෂය වන විට ඉඩම් මත කසල බැහැර කිරීම ශූන්‍ය කිරීම සහ අනෙකුත් පාරිසරික, සමාජ හා ආයතනික පාලන ඉලක්ක එහි ඇතුලත් වේ. මීට අමතරව ඒ තුළින් සමූහයේ අල්ලස් හා දූෂණ විරෝධී ප්‍රතිපත්ති ශක්තිමත් කිරීම හා ඒවා කඩකරන්නන්ට එරෙහිව කිසිදු පැකිලීමකින් තොරව ක්‍රියා කිරීම අපගේ ස්ථාවරයයි. අංශ මට්ටමින් සිදුකරන සවිස්තරාත්මක ක්‍රියාමාර්ග තුළින් සමූහයේ පාරිසරික, සමාජ හා ආයතනික පාලන අරමුණු සාක්ෂාත් කර ගැනීමට හැකිවනු ඇත.

තිරසාර අවශ්‍යතා පිලිබඳ ගෝලීය වාර්තාකරණ වැඩසටහනෙහි දකුණු ආසියානු ප්‍රඥප්තියේ සාමාජිකයකු ලෙස හේලීස් සමූහය නිල වශයෙන් අත්සන් කරන ලදී. එය ඉදිරි දශකය තුළ එක්සත් ජාතීන්ගේ තිරසාර සංවර්ධන ඉලක්කයන් සාක්ෂාත් කරගැනීම සඳහා සහාය දක්වන ව්‍යාපාර හා පාර්ශවකරුවන්ගේ තීරණාත්මක ක්‍රියාමාර්ගයක් වනු ඇත. හේලීස් පී එල් සී සහ හේලීස් වතු සමාගමේ පරිපාලිත සමාග මක් වන තලවකැලේ ටී එස්ටේට් පී එල් සී ගෝලීය වාර්තාකරණ වැඩසටහනෙහි දකුණු ආසියානු ප්‍රඥප්තියේ කලාපීය ප්‍රථම සාමාජිකයින් තිදෙනාගෙන් දෙදෙනකු වන අතර ශ්‍රී ලංකාව නියෝජනය කරන එකම සමාගම් ද්විත්වය වේ. පාරිසරික, සමාජ හා ආයතනික පාලන රාමුව හරහා සමාගමේ තිරසාර ක්‍රියාමාර්ගයන්හි ප්‍රතිඵල තහවුරු කිරීම වෙනුවෙන් ප්‍රඥප්තියේ මූලධර්ම අන්තර්ගත කිරීම හා ස්ථාපිත කිරීම සඳහා අව්‍යාජ හා දිගු කාලීන බැඳීමක් මෙම පියවර මගින් ඉදිරිපත් කරනු ලබයි. එමඟින් සමූහයේ පාරිසරික, සමාජ හා ආයතනික පාලන වාර්තාකරණයේ විශිෂ්ටත්වය සඳහා අවධානය යොමු කරනු ලබයි.

### අර්බුදයන් ඉහළ යාම සහ නැවත ප්‍රකෘති තත්ත්වයට පැමිණීමට ඇති බාධා

වර්ෂය ආරම්භ වන විට ගෝලීය ආර්ථිකය 6% ක වර්ධනයක් සමඟ නැවත යථා තත්ත්වයට පත්වීමට පුරෝකථනය කර තිබුණි. එහෙත් මෙම වර්ධනය ව්‍යුහාත්මක ගැටළු හේතුවෙන් අවදානමට ලක් විය හැකි ආර්ථිකයන් හා දියුණු ආර්ථිකයන් සමඟ සංසන්දනය කිරීමේදී සමාන ලෙස බල නොපාන ලක්ෂණ පෙන්නුම් කෙරේ. පසුබෑම් අවම කිරීම සහ ආර්ථිකය නැවත යථා තත්ත්වයට පත් කිරීමේදී ප්‍රතිපත්ති ප්‍රතිසංස්කරණය මූලික ස්ථානයක් හිමි කරගෙන ඇත. මෙම පසුබිම තුළ, ශ්‍රී ලංකාව 2021 වර්ෂයේ අප්‍රේල් මාසයේදී රසායනික පොහොර සහ අනෙකුත් කෘෂි රසායන ආනයන තහනම් කිරීමට පියවර ගත් අතර එය රටේ කෘෂිකාර්මික ක්ෂේත්‍රයට දැඩි බලපෑමක් ඇති කිරීමට හේතු විය. රටපුරා ආහාර උද්ධමනය ඉහළ යෑමට කෘෂිකාර්මික අංශය තුලින් ලද දුර්වල අස්වැන්න හේතු වූ අතර අත්‍යවශ්‍ය ආහාර ආනයනය කිරීමේ අවශ්‍යතාවක් පැනනැගිනි. 2021 සැප්තැම්බර් මාසයේදී, රසායනික පොහොර සහ අනෙකුත්

## 2021 වර්ෂය ඉලක්කම් වලින්

### ලෝක ආර්ථික වර්ධනය - 6%

| | ආදායම් දායකත්වය | ආර්ථික වර්ධනය |
|---|---|---|
| ශ්‍රී ලංකාව | 81.6% | 3.7% |
| ඉතාලිය | 4.2% | 6.5% |
| තායිලන්තය | 4.1% | 1.6% |
| මාලදිවයින | 1.8% | 18.9% |
| මියන්මාරය | 0.4% | -12.0% |
| බංගලාදේශය | 1.2% | 4.5% |
| ඕස්ට්‍රේලියාව | 0.7% | 3.8% |
| ඉන්දියාව | 0.5% | 8.9% |
| ඉන්දුනීසියාව | 1.3% | 3.7% |
| සිංගප්පූරුව | 0.8% | 7.6% |
| එක්සත් රාජධානිය | 1.2% | 7.5% |
| ඇමෙරිකා එක්සත් ජනපදය | 2.1% | 5.7% |
| ජපානය | 0.2% | 1.8% |

**ලෝක වෙළඳ ප්‍රවාහ**
▲ 25%

**ශ්‍රී ලංකාව**
ආනයන ▲ 28.5%
අපනයන ▲ 24.4%

### ශ්‍රී ලංකාව

| | 2022 අප්‍රේල් | 2021 දෙසැම්බර් | 2020 දෙසැම්බර් |
|---|---|---|---|
| දළ දේශීය නිෂ්පාදනය ( ඇ.ඩො බිලියන) | - | 84.5 | 80.7 |
| ඒක පුද්ගල ආදායම (ඇ.ඩො) | - | 3,815 | 3,695 |
| සේවා වියුක්තිය (%) | - | 5.1% | 5.50% |
| ක්ෂේත්‍රයට අනුව දළ දේශීය නිෂ්පාදනයේ වර්ධනය | | | |
| කෘෂිකාර්මික | - | 2.0% | -2.2% |
| කාර්මික | - | 5.3% | -6.9% |
| සේවා | - | 3.0% | -1.6% |
| හරිත සාමාන්‍ය ප්‍රමුඛ ණය අනුපාතය (%) | **16.4%** | 8.6% | 5.8% |
| විනිමය අනුපාතය (ඇ.ඩො 01 : රුපියල් ) | **347.06** | 199.88 | 185.52 |
| උද්ධමනය | **29.8%** | 12.1% | 6.2% |
| ආහාර උද්ධමනය | **46.6%** | 22.1% | 9.2% |
| ආහාර නොවන උද්ධමනය | **22.0%** | 7.5% | 2.0% |

කෘෂි රසායන ආනයන තහනම ඉවත් කළ අතර ඒ වන විට ගෝලීය වෙළෙඳපොලේ රසායනික පොහොර සහ අනෙකුත් කෘෂි රසායන ද්‍රව්‍යවල මිල ගණන් ඉතා සීග්‍රයෙන් ඉහළ ගොස් තිබූ අතර වී වගාවේ ප්‍රධාන කන්නය වන මහ කන්නයේ වගා කටයුතු ද ප්‍රමාද වී තිබිණ.

2021/22 මූල්‍ය වර්ෂය තුළ ඉහළ උද්ධමනයක් වාර්තා වූ අතර මිල ගණන් මත එල්ල වූ දැඩි පීඩනය පිළිබිඹු කරමින් උද්ධමනය 30% ක් දක්වා වර්ධනයක් සනිටුහන් කරනු ලැබුවේය. රුපියල අවප්‍රමාණය වීම උද්ධමනය සඳහා බලපෑ ප්‍රධාන සාධකය වූ අතර ආහාර උද්ධමනය 2022 වර්ෂයේ අප්‍රේල් මාසය අවසාන වන විට 47% දක්වා වර්ධනය විය. 2022 වර්ෂයේ ආහාර නොවන උද්ධමනය වසර තුළ සමාන රටාවක් අනුගමනය කළ අතර අප්‍රේල් මාසයේදී ඉන්ධන වල ප්‍රතිමිලකරණය හේතුවෙන් උද්ධමනය 22% ක් දක්වා වර්ධනය විය.

සේවා වියුක්තිය 5.5% සිට 5.1% දක්වා පහළ වැටුනි. කෙසේ වුවද ශ්‍රම බලකා සහභාගීත්වය 50.6% සිට 49.5% දක්වා අඩු වීම රටට අභියෝගාත්මක සාධකයක් වීමට ඉඩ ඇති අතර ඵලදායී රැකියාවන් සඳහා සහභාගී නොවන ජනගහනය ඵලදායී රැකියාවන් සඳහා සහභාගී වන ජනගහනය ඉක්මවා ඇත. මේ සඳහා විසඳුම් සෙවීම රටට ඇති විශාලම අභියෝගයක් වනු ඇත.

වසංගතයේ තුන්වන රැල්ල සංචාරක ක්ෂේත්‍රය නැවත ප්‍රකෘති තත්වයට පත්වීම ප්‍රමාද කළ අතර විදේශ විනිමය ගලා ඒමට එය ප්‍රධාන බාධාවක් විය. වසංගත කාලය තුළ රැකියා සඳහා විදේශගතවීම් වල අඩුවක් දක්නට ලැබීම නිසා විදේශ විනිමය ගලා ඒමේ ප්‍රධාන මූලාශ්‍රයක් වන විදේශ ශ්‍රමික ප්‍රේෂණ වල සැලකිය යුතු අඩුවීමක් දක්නට ලැබුණි. විධිමත් සහ අවිධිමත් වෙළෙඳපොලවල් අතර විදේශ විනිමය අනුපාතයන්හි විශාල පරතරයක් පැවතීම නිසා අවිධිමත් මාධ්‍යයවල විශාල ප්‍රසාරණයක් ද දක්නට ලැබුණි. ශ්‍රී ලංකා මහ බැංකුව විසින් අපනයනකරුවන්ට ලැබෙන අපනයන ආදායම රුපියල්වලට පරිවර්තනය කිරීමට නියෝග කළ අතර අපනයන ආදායමෙන් සහ ශ්‍රමික ප්‍රේෂණවලින් කොටසක් ආහාර, ඉන්ධන සහ ඖෂධ මිලදී ගැනීම සඳහා මහ බැංකුවට අලෙවි කරන ලෙස බැංකුවලට නියෝග කරන ලදී. විදේශ විනිමය අනුපාතයට සහාය වීම සඳහා මහ බැංකුව විසින් ගනු ලැබූ විවිධ ක්‍රියාමාර්ග හේතුවෙන් 2021/22 මූල්‍ය වර්ෂයේ මුල් මාස 11 තුළ විදේශ විනිමය අනුපාතය 2.4% ක පමණ අවප්‍රමාණයක් විය. බාහිර අංශවල ඇතිවූ අර්බුද හමුවේ රුපියල පාවීමට ඉඩ හැරීම හේතුවෙන්

# සභාපති / ප්‍රධාන විධායකගේ පණිවිඩය

2022 වර්ෂයේ මාර්තු සහ අප්‍රේල් මාසවලදී රුපියල 75% කින් අවප්‍රමාණය විය.

2021 අගෝස්තු මාසයේ සිට පොලී අනුපාතය ඉහළ ගොස් වර්ෂය තුළදී එය වර්ධනය විය. ආර්ථිකයේ මිල ස්ථායීතාවය ඉලක්ක කරගනිමින් ශ්‍රී ලංකා මහ බැංකුව 2022 වර්ෂයේ අප්‍රේල් මාසයේදී ප්‍රතිපත්ති පොලී අනුපාත පදනම් අංක 700 කින් ඉහළ දමන ලදී. විදේශ විනිමය අර්බුද නිසා ඇති වූ ඉන්ධන හා ගෑස් හිඟය හේතුවෙන් ප්‍රවාහන පද්ධතියට සහ ගෘහස්ථ කටයුතු වලට බාධා ඇති විය. උද්ධමනය සමඟ ඇතිවූ මෙම හිඟයන් හේතුවෙන් ජනතාව දැඩි අපහසුතාවයට ලක්විය. ජාත්‍යන්තර මූල්‍ය අරමුදල සමඟ සාකච්ඡා ආරම්භ කර ඇති අතර සාකච්ඡා අවසන් කර අරමුදල් නිදහස් කරන තෙක් අත්‍යවශ්‍ය ආනයන සඳහා මූල්‍යයනය කිරීමට අවශ්‍ය ණය පහසුකම් රට විසින් ලබාග නිමින් පවතී. කෙසේ වෙතත් බාහිර අංශයේ පවතින අර්බුදකාරී තත්ත්වයන් හේතුවෙන් ඉදිරි මාස 03 ක කාලය ඉතා අභියෝගාත්මක වුවත් ඉන් පසුව සිදුවන්නා වූ වෙනස්කම් තුළින් තිරසාර වෙනසක් ඇති වේ යැයි අපි සර්ව සුභවාදීව බලාපොරොත්තු වන්නෙමු.

### ධනාත්මක බවේ ශක්තිය

හේලීස් තුළ, ධනාත්මකව දිරිගැන්වූ කණ්ඩායමක ඇති බලය පිළිබඳව අපි අවබෝධ කරගෙන සිටි අතර වසංගතයේදී අභියෝග ජය ගනිමින් වඩා ශක්තිමත්ව ඊට මුහුණ දීමට අපට හැකිවිය. 2021/2022 මූල්‍ය වර්ෂය සාර්ථක කර ගැනීම වෙනුවෙන් කණ්ඩායමක් ලෙස අප කටයුතු කරනු ලැබුවේ වසර ගණනාවක් තිස්සේ අප ගොඩනඟාගත් මෙම විශ්වාසය අපගේ ඉහළම ශක්තිය බව ඔප්පු කරමිනි.

මූල්‍ය වර්ෂය තුළ වර්ධනය වූ විවිධාකාර අභියෝග හමුවේ හේලීස් සමූහය රුපියල් බිලියන 35.72ක බදු පෙර ලාභයක් වාර්තා කරනු ලැබුවේ පෙර වර්ෂයට සාපේක්ෂව 86% ක ආකර්ෂණීය වර්ධනයක් මෙන්ම ඉතිහාසයේ වාර්තා කරනු ලැබූ ඉහළම ලාභයද සනිටුහන් කරමිනි. එහිදී පිරිවැටුම රුපියල් බිලියන 241.28 සිට රුපියල් බිලියන 338.01 දක්වා 40% ක වර්ධනයක් වාර්තා කිරීමට හේලීස් සමූහය සමත්ව ඇත. ප්‍රවාහන හා සැපයුම් අංශය මඟින් සමූහයේ සමස්ත විකුණුම් වෙත 20%ක දායකත්වයක් ලබා දී ඇති අතර විකුණුම් වල වර්ධනය පෙර වසරට සාපේක්ෂව 84% කි (විකුණුම් රුපියල් බිලියන 69.27). පාරිභෝගික සහ විකුණුම් අංශද රුපියල් බිලියන 83.54 ක් දක්වා 14% ක වර්ධනයක් වාර්තා කරමින් සමස්ත පිරිවැටුම සඳහා ඉහළ දායකත්වය සපයනු ලැබීය.

සමූහ පොළී, බදු, ක්ෂය සහ ක්‍රමක්ෂයට පෙර ඉපයීම් (EBITDA) 27% ක වර්ධනයක් සමඟින් රුපියල් බිලියන 42.01 ක් වාර්තා කර ඇති අතර පොලී සහ බදු පෙර ඉපයීම් (EBIT) 29% ක වර්ධනයක් සමඟින් රුපියල් බිලියන 33.59 ක් දක්වා ඉහළ ගොස් ඇත. මෙම අගයන් සඳහා 50% කට අධික දායකත්වයක් ලබා දෙනු ලැබුවේ පාරිභෝගික සහ විකුණුම් හා ප්‍රවාහන සහ සැපයුම් යන අංශයන් විසිනි. එම අංශ දෙක සමූහයේ මුදල් ප්‍රවාහය සඳහා ඉහළ දායකත්වයක් ලබා දී ඇත.

2022 මාර්තු මාසයේදී අප වාර්තා කළ සුවිශේෂී විදේශ විනිමය ලාභය හේතුවෙන් මූල්‍ය ආදායම රුපියල් බිලියන 16.83 දක්වා 430% කින් වර්ධනය විය. අත් ආරක්ෂක, පවිත්‍රකරණය, රෙදිපිළි සහ ප්‍රවාහන සහ සැපයුම් යන අංශ මඟින් 69% වැනි සැලකිය යුතු දායකත්වයක් සමස්ත මූල්‍ය ආදායම වෙත ලබා දී ඇත. කාරක ප්‍රාග්ධන මූල්‍ය සඳහා ණය ගැනීම් ඉහළ යෑම හේතුවෙන් මූල්‍ය පිරිවැය රුපියල් බිලියන 14.88 ක් දක්වා 48% කින් වර්ධනය වී ඇත.

මූල්‍ය කාර්ය සාධනය සඳහා අපගේ ප්‍රධාන මිනුම් දණ්ඩ වන බදු පෙර ලාභය රුපියල් බිලියන 35.72 ක් දක්වා 86% කින් වර්ධනය වී ඇති අතර ඒ සඳහා ප්‍රවාහන සහ සැපයුම් මඟින් 30% කද, පාරිභෝගික සහ විකුණුම් හා අත් ආරක්ෂක අංශ මඟින් පිළිවෙලින් 16% ක හා 14% කද දායකත්වයක් ලබාදී ඇත. සංචාරක කටයුතු අංශය හැර අනෙක් සියළු අංශවල බදු පෙර ලාභය වර්ධනය වී ඇත. රෙදිපිළි, ප්‍රවාහන සහ සැපයුම් සහ පාරිසරික විසඳුම් අංශයන්හි පිළිවෙලින් 337%, 238% හා 132% ක බදු පෙර ලාභ වර්ධනයන් දැකිය හැකිය.

බදු අඩු කළ හැකි වියදම් ඉහළ යෑම නිසා බදු ගාස්තුව රුපියල් බිලියන 7.62 ක් වූ අතර සඵල බදු අනුපාතය 27% සිට 21% දක්වා පහත වැටී ඇත. ඒ අනුව 2021/22 මූල්‍ය වර්ෂයේ රුපියල් බිලියන 28.10 ක් වූ ලාභය පෙර වර්ෂයේ රුපියල් බිලියන 14.05 ට සාපේක්ෂව 100% කින් ඉහළ ගොස් ඉතිහාසයේ ඉහළම ලාභය සඳහා වූ සමූහයේ වාර්තා අතරට නව පරිච්ඡේදයක් එක් කොට ඇත.

### ඉහළ නැංවූ ධාරිතාව හා දරාගැනීමේ හැකියාව

ණයගැති හා අනෙකුත් ලැබීම්, තොග සහ දේපළ, පිරියත හා උපකරණවල ඉහළ යෑම හේතුවෙන් මුළු වත්කම් රුපියල් බිලියන 279.38 ක් දක්වා 44% කින් වර්ධනය විය. එතුළින් හේලීස් සමූහයේ මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය ප්‍රසාරණය වීමත් සමඟ ඉහළ ඉපයුම් ධාරිතාවයකට පසුබිම සැලසුනි. 2021 අප්‍රේල් මාසයේදී අත්පත් කරගත් සවුත් ඒෂියා ටෙක්ස්ටයිල් සමාගමද වසර අවසානයේ හේලීස් සමූහයේ වත්කම් සඳහා ඉහළ දායකත්වයක් ලබා දුනි. ඒ සමඟම හේලීස් ෆැබ්රික් සමූහය මෙරට විශාලතම රෙදිපිළි නිෂ්පාදකයා බවට පත් වූ අතර ආනයනය අඩු කිරීම මඟින් කර්මාන්තයේ සැපයුම් දාමය කෙටි කිරීමටද හේතු විය. ප්‍රවාහන සහ සැපයුම් අංශය තවත් බහාලුම් නැවක් අත්පත් කරගැනීමත් සමඟ ශ්‍රී ලංකාවේ විශාලතම යාත්‍රා ප්‍රමාණය ඔවුන් සතු කරගෙන එමඟින් ඉපයුම් ධාරිතාව ඉහළ යන ලදී. මීට අමතරව, වෙළෙඳපොළෙහි පැවැති විදේශ විනිමය හිඟකම හේතුවෙන් සීමිත අයුරින් හෝ බොහොමයක් අංශයන්හි ධාරිතාව ඉහළ නැංවීම සඳහා ආයෝජනය කිරීමටද අප කටයුතු කරන ලදී. හේලීස් සමූහයේ ධාරිතාවයේ සැලකිය යුතු වර්ධනයක් මෙම වසරේ පෙන්නුම් කළ අතර එමඟින් විදේශ විනිමය ඉපයීම්ද සැලකිය යුතු ලෙස වර්ධනය විය. නැව්ගත කිරීමේදී සිදුවන ප්‍රමාදයන් හේතුවෙන් නිමි භාණ්ඩවල සහ අමුද්‍රව්‍යවල තොග ප්‍රමාණය ඉහළ දැමීමට සමූහය විසින් කටයුතු කිරීම තුළින් සමූහයේ තොග 55% කින් ඉහළ ගොස් ඇත. ප්‍රවාහන සහ සැපයුම් හා පාරිභෝගික සහ විකුණුම් අංශයන් හේතුවෙන් පිළිවෙලින් 16% ක් හා 41% ක් වශයෙන් ණයගැති සහ අනෙකුත් ලැබීම් වල සැලකිය යුතු ඉහළ යාමක්ද වාර්තා විය.

රඳවාගත් ඉපයුම් වර්ධනය හේතුවෙන් සමස්ත හිමිකම් රුපියල් බිලියන 105.29ක් දක්වා 40% කින් ඉහළ ගොස් ඇත. පොලී මත ණය ගැනීම් 50% කින් ඉහළ යාම සඳහා, තොග හා ධාරිතාවය ඉහළ දැමීම වෙනුවෙන් මූල්‍යයනය වැඩි කිරීම සහ විදේශ විනිමය මුදල් ඒකක මත ණය රුපියල් බවට පරිවර්තනය කිරීම හේතු විය. ඒ අනුව ණය - හිමිකම් අනුපාතය 1.63:1 දක්වා ඉහළ ගොස් ඇති අතර තෝලනය 63% දක්වා ඉහළ ගොස් ඇත.

වර්ෂය තුළ සිදුකළ ආයෝජනයන් තුළින් හේලීස් සමූහයේ විදේශ විනිමය ද්‍රවශීලතා හැකියාවේ ව්‍යුහාත්මක වෙනස් කම් සිදු කිරීමට අප කටයුතු කර ඇත. වත්කම් වර්ධනය හේතුවෙන් විදේශ විනිමය ද්‍රවශීලතාවය ධනාත්මක ලෙස ඉහළ නැංවී ඇති අතර විදේශ විනිමය අනුපාතයේ වෙනස් වීම කෙරෙහි අපගේ ඔරොත්තු දීමේ හැකියාවද ශක්තිමත් වී ඇත.

### ආර්ථිකය වෙනුවෙන් අපේ දායකත්වය

හේලීස් සමූහය රට තුළ සමාජ, ආර්ථික ප්‍රගමනය වෙනුවෙන් සුවිසල් දායකත්වයක් දක්වන සමාග මකි. විදේශ විනිමය ආදායම ඇමරිකානු ඩොලර් මිලියන 615.98 දක්වා 45% කින් ඉහළ ගොස් ඇති

අතර එය එම කාලසීමාව තුළ රටෙහි සමස්ත අපනයනවලින් 4.2% කි. ඊට අමතරව රටට විදේශ විනිමය ගලා ඒම ශක්තිමත් කරමින් සමූහයේ විදේශීය පරිපාලිත සමාගම් තුළින් ලාභාංශ ලෙස ඇමරිකානු ඩොලර් මිලියන 6.24 ක් මෙරටට ලැබී ඇත.

29,258 ක් ශ්‍රී ලාංකිකයින් වෙත රැකියා අවස්ථා උදා කර දී ඇති හේලීස් සමූහය බස්නාහිර පළාතෙන් පිටත රැකියා අවස්ථා 62.8% ක ප්‍රමාණයක් උත්පාදනය කිරීමට සමත්ව ඇත. වර්ෂය තුළදී සමූහය විසින් දේශීය සැපයුම්කරුවන්ගේ වර්ධනයට සහාය වීම සඳහා ඔවුන් වෙත  රුපියල් බිලියන 104.59 ක් ගෙවා ඇත. අපගේ සැපයුම් දාම තුළින් තාක්‍ෂණික දැනුම සැපයීම සඳහා වන ව්‍යුහගත වැඩසටහන් ක්‍රියාත්මක වූ අතර එමඟින් 10,500 කට අධික ක්ෂුද්‍ර ව්‍යවසායකයින්ගේ ජීවනෝපායන් සඳහා සහයෝගය ලබා දී ඇත. සමස්ත දිවයිනම ආවරණය වන සමූහයේ මෙහෙයුම් මගින් ඒ ඒ අංශවල කණ්ඩායම් ඔවුන්ගේ කර්මාන්තයන්හි ප්‍රධාන කාර්යභාරයක් ඉටුකරයි. ඒවා මෙම වාර්ෂික වාර්තාවේ ආංශික විශ්ලේෂණය තුළ විස්තරාත්මකව සාකච්ඡා කොට ඇත.

## ව්‍යාපාර අංශ සමාලෝචනය

හේලීස් සමූහය එහි විකුණුම් ආදායමෙන් 52% ක් අපනයනය තුළින් ලබාගෙන ඇති අතර ඉතිරිය දේශීය වෙළෙඳපොලෙහි ප්‍රධාන ක්‍රියාකාරිකයකු ලෙස උපයා ගෙන ඇත. අත් ආරක්ෂණය, පවිත්‍රකරණය, පාරිසරික විසඳුම්, රෙදිපිළි හා ප්‍රවාහනය සහ සැපයුම් යන අංශවලින් ලැබෙන ඉපයීම් වැඩි වශයෙන් විදේශ ව්‍යවහාර මුදල් වලින් ලැබෙන අතර අනෙකුත් ආංශික ආදායම් බොහොමයක් රුපියල්වලින් උපයා ඇත. පාරිභෝගික හා විකුණුම් අංශය මුළු වත්කම්වලට අනුව විශාලතම අංශය වන අතර එය මුළු වත්කම් වලින් 23% කි. ධාරිතා ආයෝජනය හේතු කොට ගෙන ප්‍රවාහන සහ සැපයුම් හා රෙදිපිළි අංශ ඒවායේ මුළු වත්කම් වල නියෝජනය ඉහළ නංවාගෙන ඇති අතර එය වර්ෂය අවසාන වන විට මුළු වත්කම් වලින් 17% හා 9%ක් වේ. ඒ තුළින් විදේශ විනිමය උත්පාදනය ඉහළ නැංවීම සඳහා වන සමූහයේ ආයෝජන දිශානතියෙහි ව්‍යුහාත්මක වෙනස්කම් නිරූපනය වේ.

සමස්ත පිරිවැටුම ඇමරිකානු ඩොලර් බිලියන 1.60 දක්වා 25% කින් වර්ධනය වීම සමූහයේ විශිෂ්ට කාර්යසාධනය මැනවින් පෙන්නුම් කරයි. පොලී සහ බදු ගෙවීමට පෙර ඉපයුම් (EBIT) ඇමරිකානු ඩොලර් මිලියන 159.35 ක් වූ අතර පෙර වර්ෂයට සාපේක්ෂව 16% ක වර්ධනයක් මැනවින් පෙන්නුම් කරනු ලබයි. සුළු වශයෙන් ආන්තික පහත වැටීමක් සිදු වුවද විකුණුම් වල සැපයුම ප්‍රමාණවත් ලෙස ඉහළ යෑම මෙම වර්ධනයට හේතු විය. පසුගිය වසරට සාපේක්ෂව ශුද්ධ මූල්‍ය ආදායම ඉහළ යෑම නිසා ලාභදායීත්වය ඉහළ ගොස් ඇත. වර්ෂය තුළ ලාභය ලෙස ඇමරිකානු ඩොලර් මිලියන 133.28 ක් වාර්තා කර ඇති අතර එය 79% ක ආකර්ෂණීය වර්ධනයකි. ශ්‍රී ලංකා රුපියල මූල්‍ය වර්ෂය අවසාන මාසයේදී 46% කින් අවප්‍රමාණය වුවද 52% ක අපනයනය සිදුකරන සමූහයකට විදේශ විනිමය මාස 11 ක් නියාමනය කරනු ලැබීමෙන් වන බලපෑම සොයාබැලීම ඉතා වැදගත් වේ. ඇමරිකානු ඩොලර් මිලියන 24.41 ලාභාංශ හේලීස් පී එල් සී වෙත එහි පරිපාලිත සමාගම්වලින් ලැබී ඇති අතර (ඒකාබද්ධ කිරීමේදී ඉවත් කර ඇත) ඉන් 26% ක් සමූහයට ලැබී ඇත්තේ විදේශ ව්‍යවහාර මුදල්වලිනි.

## පාරිභෝගික හා විකුණුම්

සිංගර් ශ්‍රී ලංකා සමාගම වසර 145 ඉතිහාසය තුළ වාර්තා කළ ඉහළම අගය වාර්තා කරමින් පාරිභෝගික හා විකුණුම් අංශය වර්ෂය තුළ රුපියල් බිලියන 4.30 ක ලාභයක් වාර්තා කිරීමට සමත් විය. එය එහි පසුගිය වසරට සාපේක්ෂව 59% ක වර්ධනයකි. මෙරට නිෂ්පාදන අලෙවි ක්ෂේත්‍රයේ ප්‍රමුඛයා මෙන්ම නිෂ්පාදන අලෙවියේ දැවැන්තයෙකු වන සිංගර් ශ්‍රී ලංකා අඛණ්ඩව 16 වැනි වතාවටත් 2022 ජනතාවගේ සන්නාමය දිනාගැනීමට සමත් විය. සමාගමේ වර්ධනය සඳහා දිවයින පුරා විහිදුණු ශාඛා, පැහැදිලි උපාය මාර්ගික ප්‍රමුඛතා සමඟ වර්ධනය වූ නව නිෂ්පාදිතයන් සහ අන්තර්ජාල වෙළඳාම (e-commerce) ඉවහල් විය. විදුලි හා ඉලෙක්ට්‍රොනික අයිතම සඳහා ඇති තිරසාර ඉල්ලුම හේතුවෙන් විකුණුම් ආදායම රුපියල් බිලියන 83.54 දක්වා 14% කින් වර්ධනය වී ඇති අතර ඉල්ලුම සමඟ බද්ධ වූ දිවයින පුරා විහිදුනු ශාඛා ජාලය සහ අලෙවියෙන් පසු සේවා හේතුවෙන් පාරිභෝගික හා විකුණුම් වෙළෙඳ ආයතන අතර පළමු ස්ථානයේ රැඳීමට සිංගර් වෙත හැකියාව උදා වී ඇත.

විදේශ විනිමය ද්‍රවශීලතා සීමාවන් මඟහරවා ගැනීමට සැපයුම් මූලාශ්‍ර උපායමාර්ග වල කල වෙනස්කම් හේතුවෙන් දේශීයව මිලදීගැනීම ඉහළ දැමීමට අප විසින් කටයුතු කරනු ලැබීය. රෙග්නීස් සමාගමට නිෂ්පාදන පරාසය පුළුල් කිරීම තුලින් වෙළෙඳපොලෙහි සිය ස්ථාවරය ශක්තිමත් කරගැනීමට හැකිවිය. කෙසේ වෙතත් ආනයනික අමුද්‍රව්‍ය පිරිවැය සහ පොලී අනුපාතයන්හි ඉහළ යෑමේ ප්‍රවණතාව සමාගමට අභියෝගයක් වනු ඇත.

සිංගර් ෆිනෑන්ස් පී එල් සී එහි ඉතිහාසය තුළ ඉහළම කාර්යසාධනය වාර්තා කරමින් රුපියල් මිලියන 959.66 බදු පෙර ලාභයක් වාර්තා කිරීමට සමත්ව ඇත. බ්‍රෑන්ඩ් ෆිනෑන්ස් ලංකාහි ශ්‍රේණිගත

### පාරිභෝගික හා විකුණුම්

**මෙහෙයුම් ක්‍රියාත්මක වන රටවල්**
ශ්‍රී ලංකාව

- විකුණුම් ආදායම රුපියල් බිලියන 84.59 ▲ 14%
- පොලී, බදු, ක්ෂය හා ක්‍රමක්ෂය පෙර ලාභය රුපියල් බිලියන 10.35 ▲ 44%
- මෙහෙයුම් ලාභය රුපියල් බිලියන 8.5 ▲ 52%
- බදු පෙර ලාභය රුපියල් බිලියන 5.77 ▲ 46%
- බදු පසු ලාභය රුපියල් බිලියන 4.3 ▲ 46%
- ප්‍රාග්ධන වියදම් රුපියල් මිලියන 841.68
- මුළු වත්කම් රුපියල් බිලියන 91.03 ▲ 46%
- නිර්මාණය කළ අගය රුපියල් බිලියන 26.00 ▲ 43%

### ප්‍රවාහනය සහ සැපයුම්

**මෙහෙයුම් ක්‍රියාත්මක වන රටවල්**
ශ්‍රී ලංකාව/ මාලදිවයින/ බංගලාදේශය/ ඉන්දියාව/ මියන්මාරය/ සිංගප්පූරුව

- විකුණුම් ආදායම රුපියල් බිලියන 69.27 ▲ 84%
- පොලී, බදු, ක්ෂය හා ක්‍රමක්ෂය පෙර ලාභය රුපියල් බිලියන 10.02 ▲ 80%
- මෙහෙයුම් ලාභය රුපියල් බිලියන 8.42 ▲ 111%
- බදු පෙර ලාභය රුපියල් බිලියන 10.87 ▲ 238%
- බදු පසු ලාභය රුපියල් බිලියන 8.61 ▲ 243%
- ප්‍රාග්ධන වියදම් රුපියල් බිලියන 3.28
- මුළු වත්කම් රුපියල් බිලියන 67.97 ▲ 71%
- නිර්මාණය කළ අගය රුපියල් බිලියන 16.67 ▲ 87%
- විදේශ විනිමය මගින් ඉපයීම් ඇ.ඩො මිලියන 166.78

### අත් ආරක්ෂාව

**මෙහෙයුම් ක්‍රියාත්මක වන රටවල්**
ශ්‍රී ලංකාව/තායිලන්තය/ඉතාලිය

- විකුණුම් ආදායම රුපියල් බිලියන 37.86 ▲ 25%
- පොලී, බදු, ක්ෂය හා ක්‍රමක්ෂය පෙර ලාභය රුපියල් බිලියන 3.54 ▼ 43%
- මෙහෙයුම් ලාභය රුපියල් බිලියන 2.90 ▼ 47%
- බදු පෙර ලාභය රුපියල් බිලියන 5.00 ▼ 10%
- බදු පසු ලාභය රුපියල් බිලියන 4.05 ▼ 8%
- ප්‍රාග්ධන වියදම් රුපියල් බිලියන 3.11
- මුළු වත්කම් රුපියල් බිලියන 35.30 ▲ 28%
- නිර්මාණය කළ අගය රුපියල් බිලියන 12.50 ▲ 33%
- විදේශ විනිමය මගින් ඉපයීම් ඇ.ඩො මිලියන 82.28
- විදේශීය පරිපාලිත සමාගම් වලින් ලද ලාභාංශ ඇ.ඩො මිලියන 3.37

කිරීම් අනුව ලංකාවේ ඉහළම මූල්‍ය සමාගම් 10 තුළ සිටින සිංගර් ෆිනෑන්ස් ආයතනයට ඉදිරියේදී වර්ධනය වීම සඳහා විශිෂ්ඨ හැකියාවක් පවතී. මෙම ශක්තිමත් ආයතනය වෙනුවෙන් අදාළ වන ප්‍රධාන උපාය මාර්ග වන්නේ ශාඛා ජාලය පුළුල් කිරීම හා එහි ශක්තිමත් ද්‍රවශීල තත්ත්වයන් හා සන්නාමය මත කටයුතු කිරීමයි.

වර්තමානය වන විට විදේශ විනිමය සීමාවන් හා වැය කළ හැකි ආදායම් පහළ යමින් පැවතුනද ශක්තිමත් සහ ධනාත්මක ඉදිරි දැක්මක් මෙම ක්ෂේත්‍රය සතුය. වර්ධනයක් අත්පත් කර ගැනීමට ගවේශණය කළ හැකි සුදුසු ක්ෂේත්‍ර ගණනාවක් ඇති අතරම පාරිභෝගිකයන් සඳහා වන අපගේ නිෂ්පාදිත කළඹ ඉහළ නැංවීම සඳහා සැපයුම් මූලාශ්‍ර හා උපාය මාර්ගවල වෙනසක් අපේක්ෂා කරනු ලබයි. මෙම ක්ෂේත්‍රයේ වර්ධන සැලසුමක් සඳහා දිවයින පුරා විහිදුණු ජාලය, වර්ධනය වන අන්තර්ජාල අවස්ථාවන් සහ ශක්තිමත් සන්නාමය අවශ්‍ය සහයෝගය ලබා දෙනු ලැබේ.

## ප්‍රවාහනය සහ සැපයුම්

සිය ඉහළම වර්ෂය සඳහා ලාභය වන රුපියල් බිලියන 8.61 ක් ලබා දුන් ඇඩ්වාන්ටිස් සමූහය විසින් හේලීස් සමූහයේ වර්ෂය සඳහා ලාභයට 30% ක දායකත්වයක් ලබා දී ඇති අතර එය යම් අංශයක් විසින් ලබා දුන් ඉහළම දායකත්වයයි. පසුගිය වසර තුළදී මෙම අංශය අනු-අංශ 06 කට ප්‍රතිව්‍යුහගත කෙරුනි. එමඟින් පාරිභෝගික වටිනාකම් වෙනුවෙන් ඉදිරිපත් කළ යෝජනා ඉහළ නැංවීමට අංශය කටයුතු කළ අතර අංශ අතර සහයෝගීතාවය උපරිම කිරීම තුළින් රට තුල ප්‍රධාන සැපයුම් සේවා සපයන්නකු ලෙස එහි ස්ථානය ශක්තිමත් කිරීමට මෙම අංශයට හැකි විය.

ගෝලීය ගැටළු හේතුවෙන් සම්පත් දාම කළමනාකරණය තීරණාත්මක මෙහෙයුමක් බවට පත්වුනි. සැපයුම් හා ගබඩා මෙහෙයුම් සඳහා ඉල්ලුම ඉහළ යෑම, විදේශ මුදල් පරිවර්තන ලාභ ලැබීම් මෙන්ම අපනයන හා ප්‍රතිනැව්ගත ව්‍යාපාරයන්හි ශක්තිමත් වර්ධනය හේතුවෙන් මෙම ක්ෂේත්‍රයේ කාර්යසාධනය ඉහළ ගොස් ඇත. භාණ්ඩ ප්‍රවාහන ගාස්තු ඉහළ යෑමද මෙම ක්ෂේත්‍රයේ ලාභදායීත්වය සඳහා සහාය විය.

ජාත්‍යන්තර භාණ්ඩ ප්‍රවාහන කළමනාකරන අනු-අංශයට 100% කට ඉහළ විකුණුම් හා ලාභ වර්ධනයක් අත්පත් කරගැනීම සඳහා අපනයන හා ප්‍රතිනැව්ගත ව්‍යාපාර පුළුල් වීම, භාණ්ඩ ප්‍රවාහන ගාස්තු ඉහළ යෑම සහ රුපියල අවප්‍රමාණය වීම හේතු විය. නාවික හා ඉංජිනේරු අංශය විසින් බහාලුම් නෞකාවක් අත්පත් කරගනු ලැබුවේ එවැනි නෞකාවක් අයත් එකම ශ්‍රී ලාංකික සමාගම බවට පත්වෙමිනි. මීට අමතරව ශක්තිමත් ඉල්ලුම, මාලදිවයින සමඟ කටයුතු ඉහළ යෑම සහ ඉන්ධන සැපයුම් මෙහෙයුම් කටයුතු වල වර්ධනය, ලාභදායීත්වය ඉහළ යාමට හේතු විය. සැපයුම්දාම ගැටළු මඟහරවා ගැනීම සඳහා තොග ඉහළ නංවා ගැනීමත්, පාරිභෝගික තොග කළමනාකරණ විශේෂඥතාවයන් ලබාගැනීමත් නිසා ඒකාබද්ධ සැපයුම් සේවා අනු-අංශයේ ඉල්ලුම තුළ ශක්තිමත් වර්ධනයක් දක්නට ලැබුණි.

විද්‍යුත් වාණිජ කටයුතුවල වර්ධනයේ සහයෝගයෙන් සහ සිටිපැක් සමඟ අවසන් පාරිභෝගිකයා දක්වා භාණ්ඩ බෙදාහැරීම මඟින් "වේගවත් භාණ්ඩ ප්‍රවාහන" අනු-අංශයේ ව්‍යාපාර කටයුතු ශක්තිමත් විය. ව්‍යාපෘති හා ඉංජිනේරු අනු-අංශය, පෙර-ඉංජිනේරු වානේ ගොඩනැගිලි ඉදිකිරීමේ ක්ෂේත්‍රයේ නායකත්වය ගෙන කටයුතු කළද මහා පරිමාණ යටිතල පහසුකම් සංවර්ධන ව්‍යාපෘතිවල මන්දගාමී බව හේතුවෙන් අහිතකර බලපෑමක් ඇති විය. දේශපාලන අස්ථාවරභාවය හේතුවෙන් මියන්මාරයේ ව්‍යාපාර කටයුතුවලට බාධා ඇති වුවද බංගලාදේශය, ඉන්දුනීසියාව හා මාලදිවයින වැනි රටවල ජාත්‍යන්තර මෙහෙයුම්හි ස්ථාවර වර්ධනයක් වාර්තා කිරීමට මෙම අංශය සමත්ව ඇත. භාණ්ඩ ප්‍රවාහනයේ වර්ධනය හේතුවෙන් ගුවන් සේවා අනු-අංශයට පසුගිය මූල්‍ය වර්ෂය යහපත් වසරක් විය. වර්ෂය තුළදී යුනිසිස්ට් ඉංජිනියරින් පී එල් සී හි මෙහෙයුම් කටයුතු විධිමත් කිරීම සඳහා අවධානය යොමු කළ අතර ඉදිරි වසර තුළ එහි වර්ධනයක් අපේක්ෂා කරනු ඇත.

වටිනාකම් දාමය පුරා වූ පුළුල් පැවැත්ම සහ ඉහළ ධාරිතාවය ඇඩ්වාන්ටිස් සමූහයේ ස්ථාවරත්වය සහ ඉදිරි වර්ධනය සඳහා අඩිතාලම සපයා දී ඇත. අතීත වාර්තා, පිළිගැනීම් සහ කැපවූ කණ්ඩායම් වල සහාය ඇඩ්වාන්ටිස් සමූහයේ වර්ධන අපේක්ෂාවන් ශක්තිමත් කරයි.

## අත් ආරක්ෂාව

අත් ආරක්ෂණ අංශයේ විකුණුම් වර්ධනය 25% ක් වූ අතර ඒ සඳහා භාණ්ඩ ප්‍රමාණ වර්ධනය සහ තෝරාගත් වෙළෙඳපොලවල පාරිභෝගිකයින් අත්පත් කරගැනීම හේතු විය. සමස්තයක් ලෙස ගත්විට, පැවැති වසංගත තත්ත්වය සමඟ පසුගිය වසරේ ඉල්ලුමෙහි ඇතිවූ ඉහළ යෑමෙන් පසුව මෙම වසරේ පළමු අර්ධය තුළ වෙළෙඳපොළ සාමාන්‍යකරණය වීමක් දක්නට ලැබුණි. ඒ අනුව පාරිභෝගිකයින් පෙර වර්ෂයේදී තොග රැස්කිරීම නිසා ආරම්භයේදී විකුණුම් මන්දගාමී වුවද අවසාන කාර්තු දෙකේදී වර්ධනයක් දැක ගත හැකිවිය. තවත් අභියෝගාත්මක තත්ත්වයක් නිර්මාණය කරනු ලැබුවේ රබර් මිල ඉහළ යෑම නිසා පිරිවැය මත

### පවිත්‍රකරණය

**මෙහෙයුම් ක්‍රියාත්මක වන රටවල්**
ශ්‍රී ලංකාව/ඉන්දුනීසියාව/තායිලන්තය/ එක්සත් රාජධානිය/ඕස්ට්‍රේලියාව/ ඇමෙරිකා එක්සත් ජනපදය/ සිංප්පූරුව/ඉන්දියාව/බ්‍රිතාන්‍ය වර්ජිං දූපත

- විකුණුම් ආදායම රුපියල් බිලියන 32.75 ▲ 29%
- පොළී, බදු, ක්ෂය හා ක්‍රමක්ෂය පෙර ලාභය රුපියල් බිලියන 3.72 ▼ 26%
- මෙහෙයුම් ලාභය රුපියල් බිලියන 3.08 ▼ 31%
- බදු පෙර ලාභය රුපියල් බිලියන 4.64 ▲ 4%
- බදු පසු ලාභය රුපියල් බිලියන 3.71 ▲ 4%
- ප්‍රාග්ධන වියදම් රුපියල් බිලියන 1.68
- මුළු වත්කම් රුපියල් බිලියන 38.16 ▲ 66%
- නිර්මාණය කළ අගය රුපියල් බිලියන 10.17 ▲ 28%
- විදේශ විනිමය මඟින් ඉපයීම් ඇ.ඩො මිලියන 68.95
- විදේශීය පරිපාලිත සමාගම් වලින් ලද ලාභාංශ ඇ.ඩො මිලියන 2.69

### කෘෂිකර්මාන්තය

**මෙහෙයුම් ක්‍රියාත්මක වන රටවල්**
ශ්‍රී ලංකාව/බංගලාදේශය

- විකුණුම් ආදායම රුපියල් බිලියන 24.09 ▲ 25%
- පොළී, බදු, ක්ෂය හා ක්‍රමක්ෂය පෙර ලාභය රුපියල් බිලියන 3.26 ▲ 43%
- මෙහෙයුම් ලාභය රුපියල් බිලියන 3.08 ▲ 52%
- බදු පෙර ලාභය රුපියල් බිලියන 2.30 ▲ 35%
- බදු පසු ලාභය රුපියල් බිලියන 1.71 ▲ 41%
- ප්‍රාග්ධන වියදම් රුපියල් මිලියන 293
- මුළු වත්කම් රුපියල් බිලියන 25.83 ▲ 61%
- නිර්මාණය කළ අගය රුපියල් බිලියන 8.01 ▲ 55%
- විදේශ විනිමය මඟින් ඉපයීම් ඇ.ඩො මිලියන 13.19
- විදේශීය පරිපාලිත සමාගම් වලින් ලද ලාභාංශ ඇ.ඩො මිලියන 0.18

### වැවිලි

**මෙහෙයුම් ක්‍රියාත්මක වන රටවල්**
ශ්‍රී ලංකාව

- ආදායම රුපියල් බිලියන 17.37 ▲ 9%
- පොළී, බදු, ක්ෂය හා ක්‍රමක්ෂය පෙර ලාභය රුපියල් බිලියන 3.02 ▲ 28%
- මෙහෙයුම් ලාභය රුපියල් බිලියන 2.45 ▲ 30%
- බදු පෙර ලාභය රුපියල් බිලියන 2.85 ▲ 61%
- බදු පසු ලාභය රුපියල් බිලියන 2.62 ▲ 69%
- ප්‍රාග්ධන වියදම් රුපියල් මිලියන 859
- මුළු වත්කම් රුපියල් බිලියන 18.19 ▲ 12%
- නිර්මාණය කළ අගය රුපියල් බිලියන 10.04 ▲ 22%
- විදේශ විනිමය මඟින් ඉපයීම් ඇ.ඩො මිලියන 34.94

ඇති පීඩනය ඉහළ යාමයි. ඒ හේතුවෙන් වර්ෂය සඳහා ලාභය රුපියල් බිලියන 4.04 ක් දක්වා පහළට වැටුණු අතර එය වාර්තා වූයේ හේලීස් සමූහයේ වර්ෂය සඳහා ලාභයෙන් 14% ක් ලෙසයි.

මෙම අංශ විසින් සමස්ත නිෂ්පාදනාගාර 05 හිම ධාරිතාවන් ඉහළ නැංවීම සඳහා අවධානය යොමු කොට ඇති අතර ඉහළ වටිනාකම් හා සහායක අත්වැසුම් කාණ්ඩවල ඉහළ අගයක් එකතු කළ නිෂ්පාදන වෙත යොමු වීමටද අවධානය යොමු කර ඇත. නවක ගොවීන් 2,000 වැඩි පිරිසක් එකතු කරගනිමින් සිදුකළ ෆස්ට් ලයිට් වැඩසටහන මඟින් සැපයුම්දාම ශක්තිමත් කළ අතර ගොවීන්ගේ ගැටළු විසඳීම සඳහාද ඒ තුළින් ශක්තියක් සපයන ලදී. උසස් තත්වයේ ක්‍රීඩා අත්වැසුමක්ද සමඟින් 20 කට අධික නව නිෂ්පාදන මෙම අංශය විසින් වෙළෙඳපොළට හඳුන්වා දෙන ලදී. ඊට අමතරව, ලෝක බුද්ධිමය දේපළ කාර්යාලයට යොමු කළ නිෂ්පාදනයක්ද ඇතුළුව නව පේටන්ට් බලපත්‍ර 05 කට අයදුම් කර ඇත. මෙම අංශය පසුගිය කාර්තු දෙකෙහි දක්නට ලැබූ ගම්‍යතාවය පවත්වාගනිමින් ඉදිරි වර්ෂයේ වර්ධනය සඳහා හොඳින් සූදානම්ව සිටී. පාරිසරික, සමාජ හා පාලන අරමුණු මත වූ දැඩි කැපවීම සහ ශක්තිමත් පාරිභෝගික සබඳතා එහි වර්ධන අපේක්ෂාවන් තහවුරු කර ඇත.

### පවිත්‍රකරණය

ලොව විශාලතම සක්‍රිය පොල් කටු කාබන් නිෂ්පාදකයා ලෙස කීර්තියක් අත් කරගෙන ඇති හේකාබ් සමූහය භූගෝලීය වශයෙන් ව්‍යාප්ත වී ඇත. ලෝකය හරිත හා සුක්ෂ්ම ආර්ථිකයක් වෙත යොමුවෙමින් පවතින වාතාවරණයක් තුළ පුළුල් පරාසයක විහිදුණු කර්මාන්ත ක්ෂේත්‍ර සඳහා විවිධ භාවිතයන් සඳහා ගත හැකි නව්‍ය නිෂ්පාදිතයන් හේකාබ් සමූහය විසින් පිළියෙල කරනු ලබයි. වාතය සහ ජලය පවිත්‍රකරණය සඳහා වන වැඩිවන අවශ්‍යතාවය සහ දැඩි පාරිසරික හා ආහාර සුරක්ෂිතතා රෙගුලාසි වල වර්ධනය මෙම අංශයේ නිෂ්පාදන ඉල්ලුම තීරණය කරන ප්‍රධාන සාධක වේ. වෛද්‍ය විද්‍යාව, බලශක්ති සහ තාක්ෂණ වැනි ක්ෂේත්‍රයන්ට ඇති සම්බන්ධතාවය තුළින් පාරිභෝගික කේන්ද්‍රීය නවෝත්පාදනයන් හරහා ඉහළ අගය එකතු කිරීමේ හැකියාවක් ලැබී ඇති අතර නවීන තාක්ෂණයන්ට මෙන්ම ස්ථාවර කර්මාන්තවලටද අදාළ නිෂ්පාදන වර්ධනය කිරීමට හැකියාව ලැබී ඇත.

ඉහළ අගය එකතු කළ නිෂ්පාදිත මත වැඩි අවධානයක් යොමු කිරීම, වෙළෙඳපොල සංවර්ධනය සහ ඉහළ යන රන් මිල හේතුවෙන් විකුණුම් ආදායම රුපියල් බිලියන 32.75 දක්වා 29% කින් වර්ධනය වී ඇත. එහෙත් ඉහළ ගිය ප්‍රවාහන වියදම් සහ අමුද්‍රව්‍ය පිරිවැය නිසා ආන්තික අනුපාතය පහළ වැටුණි. ඊට අමතරව, කාරක ප්‍රාග්ධනය සඳහා මූල්‍ය පිරිවැය ඉහළ යෑමේ ප්‍රතිඵලයක් ලෙස අමුද්‍රව්‍ය තොග සහ නිමි භාණ්ඩ තොග රැස් කර තබාගැනීමට අවශ්‍ය විනි. කෙසේ වෙතත්, මාර්තු මාසයේදී රුපියල දැඩි ලෙස අවප්‍රමාණය වීම නිසා මූල්‍ය ආදායම ඉහළ ගිය අතර ඒ තුළින් බදු පෙර ලාභය සහ වර්ෂය සඳහා ලාභය පිළිවෙලින් රුපියල් බිලියන 4.64 ක් සහ රුපියල් බිලියන 3.71 ක් විය. එය ආරම්භයේ සිට අඛණ්ඩව දෙවන වසරටත් වාර්තා කළ ඉහළම ලාභයයි.

විශේෂයෙන්ම චීනයේ හා උතුරු ඇමෙරිකාවේ සක්‍රිය කාබන් සඳහා ඇති ඉල්ලුම සැලකිය යුතු ලෙස වර්ධනය වනු ඇතැයි අපේක්ෂා කරන හෙයින් පවිත්‍රකරණ අංශයේ ඉදිරි දැක්ම වඩාත් ධනාත්මක වේ. නවෝත්පාදන ක්‍රියාවලි මඟින් නිෂ්පාදනය කරනු ලබන දෘඪ කාබන්, සුපිරි විදුලි උත්පාදන කාබන් සහ ඍඛක නිෂ්පාදන වෙළෙඳපොළ සංවර්ධනයට සහ ප්‍රචලිත කිරීමට සහාය වනු ලබයි. භාණ්ඩ ප්‍රවාහන වියදම්වල ඇති අභියෝග මඟ හරවා ගැනීම සඳහා අමුද්‍රව්‍ය ලබාගත හැකි වෙළෙඳපොළ වෙත අපගේ ව්‍යාපාර කටයුතු පුළුල් කිරීම තුළින් විදේශයන්හිද වර්ධනීය තත්ත්වයක් ළඟාකරගැනීමට අපට වැඩි අවස්ථාවක් පවතී. මධ්‍ය කාලීන වර්ධනය සඳහා වඩා තීරණාත්මක ක්ෂේත්‍රයන්හි මානව දක්ෂතා ආකර්ෂණය කරගැනීම, සංවර්ධනය කිරීම සහ රඳවාගැනීම වැදගත් වේ.

### කෘෂිකර්මාන්තය

2021/22 තුළදී කෘෂිකාර්මික අංශය අභියෝග ගණනාවක් කළමනාකරණය කරගනිමින් අඛණ්ඩව දෙවන වසරටත් එහි ඉහළම ලාභය වූ රුපියල් බිලියන 1.71 ක ලාභයක් වාර්තා කරනු ලැබුවේ පසුගිය වර්ෂයට සාපේක්ෂව 41% ක වර්ධනයක් සනිටුහන් කරමිනි. රටේ කෘෂිකර්මාන්ත ක්ෂේත්‍රය වෙනුවෙන් දිරි දෙන මෙම අංශය කෘෂිකර්මාන්තය නවීකරණය කිරීම සහ ගොවියන්ගේ ධාරිතා වර්ධනය හරහා රටෙහි ආහාර සුරක්ෂිතතාවය වෙනුවෙන් කටයුතු කරන අතරම ගොවීන්ට අවශ්‍ය උපකරණ, බීජ සහ අනෙකුත් යෙදවුම් ලබා දී ඔවුන්ගේ අස්වැන්න එකඟ වූ මිල ගණන්වලට මිලට ගෙන ගෝලීය සැපයුම් දාමයට ඔවුන් සම්බන්ධ කිරීමද සිදු කරනු ලබයි.

2021 වර්ෂයේ අප්‍රේල් මාසයේදී පනවනු ලැබූ රසායනික පොහොර සහ කෘෂි රසායන තහනම යල සහ මහ කන්න වලට දැඩි බලපෑමක් ඇති කළ හෙයින් අස්වැන්න පහත වැටුණි. 2021 සැප්තැම්බර් මාසයේදී එම තීරණය ආපසු හැරවුවද අවශ්‍ය ගොවිපල සැකසීම් ප්‍රමාද විය. රසායනික පොහොර සහ කෘෂි රසායන තහනමේ බලපෑම සැලකිල්ලට ගනිමින් මෙම අංශය විසින් එහි පිරිවැය පහළ දැමීමට හා කාර්යක්ෂතාවය ඉහළ නැංවීමට කටයුතු කළ අතර ඉහළ ගිය

#### කාර්මික යෙදවුම්, විදුලිබල හා බලශක්ති

මෙහෙයුම් ක්‍රියාත්මක වන රටවල්
ශ්‍රී ලංකාව/බංගලාදේශය

- විකුණුම් ආදායම රුපියල් බිලියන 7.04 ▲ 41%
- පොළී, බදු, ක්ෂය හා ක්‍රමක්ෂය පෙර ලාභය රුපියල් බිලියන 1.54 ▲ 8%
- මෙහෙයුම් ලාභය රුපියල් බිලියන 1.20 ▲ 9%
- බදු පෙර ලාභය රුපියල් බිලියන 1.22 ▲ 22%
- බදු පසු ලාභය රුපියල් බිලියන 1.05 ▲ 32%
- ප්‍රාග්ධන වියදම් රුපියල් මිලියන 68.34
- මුළු වත්කම් රුපියල් බිලියන 15.20 ▲ 13%
- නිර්මාණය කළ අගය රුපියල් බිලියන 2.62 ▲ 15%

#### කොහු ආශ්‍රිත නිෂ්පාදන

මෙහෙයුම් ක්‍රියාත්මක වන රටවල්
ශ්‍රී ලංකාව/ඉන්දියාව

- විකුණුම් ආදායම රුපියල් බිලියන 11.13n ▲ 42%
- පොළී, බදු, ක්ෂය හා ක්‍රමක්ෂය පෙර ලාභය රුපියල් මිලියන 892.43 ▲ 9%
- මෙහෙයුම් ලාභය රුපියල් මිලියන 717.99 ▲ 9%
- බදු පෙර ලාභය රුපියල් බිලියන 1.77 ▲ 132%
- බදු පසු ලාභය රුපියල් බිලියන 1.50 ▲ 127%
- ප්‍රාග්ධන වියදම් රුපියල් මිලියන 360.77
- මුළු වත්කම් රුපියල් බිලියන 17.52 ▲ 34%
- නිර්මාණය කළ අගය රුපියල් බිලියන 3.09 ▲ 88%
- විදේශ විනිමය මඟින් ඉපයීම් ඇ.ඩො මිලියන 43.67

#### ඉදිකිරීම් ද්‍රව්‍ය

මෙහෙයුම් ක්‍රියාත්මක වන රටවල්
ශ්‍රී ලංකාව

- රුපියල් බිලියන 9.52 ▲ 62%
- පොළී, බදු, ක්ෂය හා ක්‍රමක්ෂය පෙර ලාභය රුපියල් බිලියන 1.78 ▲ 22%
- මෙහෙයුම් ලාභය රුපියල් බිලියන 1.49 ▲ 21%
- බදු පෙර ලාභය රුපියල් බිලියන 1.38 ▲ 35%
- බදු පසු ලාභය රුපියල් බිලියන 1.15 ▲ 37%
- ප්‍රාග්ධන වියදම් රුපියල් මිලියන 747.49
- මුළු වත්කම් රුපියල් බිලියන 12.07 ▲ 57%
- නිර්මාණය කළ අගය රුපියල් බිලියන 2.90 ▲ 19%
- විදේශ විනිමය මඟින් ඉපයීම් ඇ.ඩො මිලියන 6.73

## සභාපති / ප්‍රධාන විධායකගේ පණිවිඩය

ණය අවදානම අවම කිරීම සඳහා මුදල් මත පදනම් වූ ව්‍යාපාර ආකෘතියකට ගමන් කළේය. කෘෂි උපකරණ අනු-අංශය වෙළෙඳපොළෙහි තම නායකත්වය තවත් වර්ධනය කළ අතර එය අංශයේ ලාභදායීත්වයට ප්‍රධාන සාධකයක් විය.

වසංගත තත්ත්වය හේතුවෙන් ගෝලීය වෙළෙඳපොළ තුළ බීජ සැපයුම අභියෝගයන්ට මුහුණ දී ඇතත් ස්ථායීව සිටින ගෝලීය පාරිභෝගිකයන් සමඟ කලාපය තුළ ව්‍යාපාර කටයුතු ව්‍යාප්ත කිරීම සඳහා බංග්ලාදේශයේ නව බීජ සැකසුම් කර්මාන්ත ශාලාවක් සමඟ මල් බීජ මෙහෙයුම් පුළුල් කරන ලදී. සැපයුම් සීමාවන්ගෙන් ක්ෂේත්‍රයට බලපෑමක් ඇති වුවද බංග්ලාදේශ මෙහෙයුම්හි බාධාවකින් තොරව අමුද්‍රව්‍ය සැපයීමට හැකිවීම නිසා අද වන විට ඉහළම සාර්ථකත්වය වාර්තා කිරීමට සමත්ව ඇත.

පොහොර තහනම, උද්ධමනය, රට වසා දැමීම්, ඉන්ධන හිඟය සහ යෙදවුම් මිල ඉහළ යෑම මෙන්ම දුර්වල වගා කන්න දෙක නිසා ගොවීන් දැඩි ලෙස පීඩාවට පත්වී ඇත. රටේ ශ්‍රම බලකායෙන් 30% ක් නියෝජනය කරන ගොවි ජනතාවට ආහාර සුරක්ෂිතතාව සහ ජීවනෝපායන් යථා තත්ත්වයට පත් කිරීම සඳහා සහය වීමට විසඳුම් සෙවීම අත්‍යවශ්‍ය වේ. මෙම ක්ෂේත්‍රයේ ස්ථායීතාවයට හා වර්ධනය වෙනුවෙන් කෘෂිකර්මාන්ත අංශය සියලු දෙනාටම ජයග්‍රහණය කළ හැකි විසඳුම් අඛණ්ඩව ගවේෂණය කරමින් සිටී.

### වැවිලි

සැලකිය යුතු අභියෝග හමුවේ පවා වැවිලි අංශය ශක්තිමත් කාර්ය සාධනයක් පෙන්නුම් කරමින් වර්ෂය තුළ රුපියල් බිලියන 2.62 ක ලාභයක් වාර්තා කළ අතර එය පෙර වර්ෂයට සාපේක්ෂව 69% ක වර්ධනයකි. තේ වෙන්දේසියේදී GSA මිල ගණනය කිරීමේදී ඉහළම මිල ගණන් 10 අතරට අපගේ නිෂ්පාදිත පැමිණීම අගය කළ යුතු කරුණක් වේ. මෙම වර්ෂය තුළ සමාගම් විසින් නායකත්වය පිළිබඳ පුහුණුවක් වතු කළමනාකරණ කණ්ඩායම්වලට ලබා දෙන ලදී. සමාගම් දෙකම ග්‍රේට් ප්ලේස් ටු වර්ක් ආයතනය මගින් සිදු කරනු ලැබූ සමීක්ෂණය මඟින් 90% මට්ටමේ ලකුණු ලබාගත් අතර එම සමීක්ෂණය සඳහා අහඹු ලෙස තෝරාගත් වැවිලි අංශයේ සේවකයින් 2,000 ක් සහිත පළමු සමාගම් ලෙසද එය විශේෂ වේ. වතුවල පදිංචි සේවකයින් සඳහා අපගේ ආරක්ෂාව හා සැලකිල්ල පිළිඹිබු කරමින් තලවකැලේ තේ වතු ආසියාවේ දෙවන ස්ථානට පත් ව ඇති අතර හොඳම තේ දළු නෙලීමේ සම්මානය සහ පුහුණුව සමඟ සේවකයින් දිරිමත් කිරීමටද කටයුතු කර ඇත.

රසායනික පොහොර සහ කෘෂි රසායන තහනම දැඩි දුෂ්කරතාවයක් එල්ල කරන්නක් වුවද ප්‍රතිජනක කෘෂිකාර්මික පිළිවෙත් මඟින් අප එය ජයගන්නා ලදී. එක් එක් අංශය විසින් වළවල් හැරීම සඳහා යන්ත්‍ර මිලදී ගත් අතර පසුව එම වලවල් කොම්පෝස්ට් ද්‍රව්‍ය වලින් පුරවන ලදී. අතින් වල් පැලෑටි ගැලවීම සඳහා දිරිගැන්වීමක් ලෙස අප වල් පැලෑටි මිලදී ගනු ලැබේ. පසුව ඒවා කොම්පෝස්ට්කරණය සඳහා යොදා ගනී. එමඟින් වගාබිම් පිරිසිදු වූ අතර සේවකයින්ට අතිරේක ආදායමක්ද හිමිවිය. මේ නිසා වතු හැර ගිය සේවකයින් පවා වතු වල රැකියා අවස්ථා සඳහා නැවත පැමිනෙමින් ඇත. මෙම අංශයේ කප්පාදු කිරීමේ කටයුතු ඇතුළුව පූර්ව අස්වනු කටයුතු වලදී යාන්ත්‍රීකරණය පිළිබඳ සලකා බැලූ නමුත් ගුණාත්මකභාවය පවත්වා ගැනීම සහතික කිරීම සඳහා අතින් දළු නෙලීමේ පුරුද්ද පවත්වාගෙන යයි.

බෝග විවිධාංගීකරණය කෙරෙහි මෙම අංශය තවදුරටත් අවධානය යොමු කරන අතර ඒ අනුව තෙවැනි බෝගය ලෙස පොල් වගා කරනු ලැබේ. ගසේ සෑම කොටසක්ම භාවිතයට ගත හැකි, නඩත්තුව අවම ශාකයක් නිසා එය ආකර්ෂණීය ව්‍යාපෘතියක් වනු ඇත. ස්ට්‍රෝබෙරි සඳහා හරිතාගාර සංඛ්‍යාව දෙගුණ කර ඇත. පිරිසිදු බලශක්ති උත්පාදනය සඳහා අපගේ කර්මාන්තශාලා 05 ක සූර්ය බලශක්ති පද්ධතිද ස්ථාපනය කර ඇත.

හරිත තේ සංස්කෘතියක් තිබියදී පවා පසුගිය වසර 03 තුළ චීනය වෙත තේ අපනයනය කළ විශාලතම තේ අපනයනකරු බවට පත්වූ මැබ්රොක් සමාගම වර්ෂය තුළදී විශිෂ්ඨ ප්‍රතිඵල වාර්තා කර ඇත. එසේම නව්‍ය වූ මිශ්‍රණ වෙළඳපොළට ඉදිරිපත් කරමින් වෙනස් වූ ප්‍රවේශයකට සමාගම යොමු විය. අප විසින් පානයට සූදානම් තේ (Ready to Drink Tea) සංවර්ධනය කළ අතර නිෂ්පාදකයින්ටද අලෙවි කරනු ලැබීය. මෙම නිෂ්පාදිතය තායිවානයේ සාර්ථක වී ඇත. මැබ්රොක් සමාගම ජපානයට තේ අපනයනය කරන 3 වන විශාලතම අපනයනකරු වන අතර එහි විශාලතම සමාගම් කිහිපයකට තේ සපයනු ලබයි. රස කාණ්ඩ පිළිබඳ අවබෝධය සාර්ථකත්වයට මූලික හේතුවක් වූ අතර ප්‍රධාන වෙළඳපොළ තවදුරටත් වර්ධනය වීමේ ඉඩකඩ සහිතව විකුණුම් ආදායම සහ ලාභය 100% කින් ඉහළ නැංවීමට සමාගමට හැකි විය.

වැවිලි සහ තේ අපනයන සමාගම් වල ඉදිරි දැක්ම ධනාත්මක බව සිතිය හැක. ඒ සඳහා බෝග විවිධාංගීකරණය සඳහා වන සැලසුම් සහ

#### රෙදිපිළි

**මෙහෙයුම් ක්‍රියාත්මක වන රටවල්**
ශ්‍රී ලංකාව

- විකුණුම් ආදායම රුපියල් බිලියන 31.67 ▲ 117%
- පොළී, බදු, ක්ෂය හා ක්‍රමක්ෂය පෙර ලාභය රුපියල් බිලියන 2.50 ▲ 93%
- මෙහෙයුම් ලාභය රුපියල් බිලියන 1.76 ▲ 100%
- බදු පෙර ලාභය රුපියල් බිලියන 3.16 ▲ 337%
- බදු පසු ලාභය රුපියල් බිලියන 2.69 ▲ 270%
- ප්‍රාග්ධන වියදම් රුපියල් බිලියන 2.29 ▲ 217%
- මුළු වත්කම් රුපියල් බිලියන 36.71
- නිර්මාණය කළ අගය රුපියල් බිලියන 7.41 ▲ 165%

#### සංචාරක කටයුතු

**මෙහෙයුම් ක්‍රියාත්මක වන රටවල්**
ශ්‍රී ලංකාව/මාලදිවයින

- විකුණුම් ආදායම රුපියල් බිලියන 3.42 ▲ 165%
- පොළී, බදු, ක්ෂය හා ක්‍රමක්ෂය පෙර ලාභය රුපියල් මිලියන 128.67 ▲ 112%
- මෙහෙයුම් අලාභය රුපියල් බිලියන 1.02 ▲ 44%
- බදු පෙර අලාභය රුපියල් බිලියන 1.70 ▲ 31%
- බදු පසු අලාභය රුපියල් බිලියන 1.67 ▲ 29%
- ප්‍රාග්ධන වියදම් රුපියල් මිලියන 360.22
- මුළු වත්කම් රුපියල් බිලියන 18.66 ▲ 19%
- නිර්මාණය කළ අගය රුපියල් බිලියන 1.56 (2021 - රුපියල් මිලියන -3)

#### වෙනත්

**මෙහෙයුම් ක්‍රියාත්මක වන රටවල්**
ශ්‍රී ලංකාව/නෙදර්ලන්තය/ජපානය/ එක්සත් රාජධානිය

- විකුණුම් ආදායම රුපියල් බිලියන 10.35 ▲ 112%
- පොළී, බදු, ක්ෂය හා ක්‍රමක්ෂය පෙර ලාභය රුපියල් බිලියන 6.69 ▲ 46%
- මෙහෙයුම් ලාභය රුපියල් බිලියන 6.52 ▲ 48%
- බදු පෙර ලාභය රුපියල් බිලියන 4.57 ▲ 155%
- බදු පසු ලාභය රුපියල් බිලියන 4.50 ▲ 165%
- ප්‍රාග්ධන වියදම් රුපියල් මිලියන 149.37
- මුළු වත්කම් රුපියල් බිලියන 79.46 ▲ 10%
- නිර්මාණය කළ අගය රුපියල් බිලියන 11.51 ▲ 53%

දැනට පවතින හා නව වෙළඳපොල වල වර්ධනය වීම සඳහා මැබ්රොක් සමාගම සතු හැකියාව හේතු වනු ඇත.

## කාර්මික යෙදවුම්, විදුලිබල හා බලශක්ති

කාර්මික යෙදවුම්, විදුලිබල හා බලශක්ති අංශය සිය නිෂ්පාදන කළඹ සහ භූගෝලීය වෙළෙඳපොළ පුළුල් කරමින් වර්ෂය සඳහා රුපියල් බිලියන 1.05 ක ලාභයක් වාර්තා කළ අතර එය පසුගිය වර්ෂයට සාපේක්ෂව 32% ක වර්ධනයකි. කාර්මික යෙදවුම් අංශය විශේෂිත අමුද්‍රව්‍ය කෙරෙහි අවධානය යොමු කළ අතර නව නිෂ්පාදන සංවර්ධනය කිරීම සඳහා පාරිභෝගිකයින් සමඟ එකතු වී කටයුතු කරන ලදී. එසේම ඉන්දුනීසියාව, තායිලන්තය හා සාර්ක් රටවල් පුරා තම පැවැත්ම තහවුරු කිරීමට ආයතනයට හැකි විය. ලයිෆ් සයන්ස් ආයතනයද නිෂ්පාදන කළඹ පුළුල් කිරීමට කටයුතු කරනු ලැබූ අතර ඩී එන් ඒ පරීක්ෂණ යන්ත්‍ර මාලදිවයින වෙතද හඳුන්වා දීමට හැකියාවක් ලැබිනි. විදුලි බල හා බලශක්ති අංශයද එවැනිම උපායමාර්ගයන් අනුගමනය කළ අතර සිංගර් ජාලය හරහා බෙදාහරින ලද කුඩා පරිමාණ විදුලි ජනන යන්ත්‍ර මාලදිවයිනට අපනයනය කිරීමට හැකියාව ලැබුනි. බලශක්ති අංශය සූර්ය හා සුළං මත පුනර්ජනනීය බලශක්ති ව්‍යාපෘති 05 ක් සඳහා අයදුම් කළ අතර ඒ තුළින් මෙගා වොට් 100 ක්ව පවතින ධාරිතාවය මෙගා වොට් 500 ක් දක්වා ඉහළ දැමීමට අපේක්ෂා කරයි.

මෙම අංශය සඳහා වූ අනාගත සැලසුම් මඟින් විදේශ වෙළෙඳපොළ වෙත පිවිසීම සහ ලැබිය යුතු මුදල් ප්‍රශස්ථ මට්ටමින් පවත්වා ගැනීම සඳහා ද්‍රවශීලතාවය කළමනාකරණය කිරීම පිළිබඳ අවධානය යොමු කර ඇති අතර ප්‍රධාන මෙහෙයුම්කරුවන්ගේ සහයෝගයද ඇතිව යම් යම් යෙදවුම් නිෂ්පාදනය පිළිබඳ සොයා බලමින් සිටී.

## කොහු ආශ්‍රිත නිෂ්පාදන

පසුගිය මූල්‍ය වර්ෂය තුළ කොහු ආශ්‍රිත නිෂ්පාදන අංශය ශක්තිමත් කාර්ය සාධනයක් වාර්තා කරනු ලැබුවේ වර්ෂය තුළ පිරිවැටුම 42% කින් වර්ධනය කර ගනිමිනි. එම වසරේදී සමාගම් ඉතිහාසයේ පළමු වරට වර්ෂය සඳහා ලාභය රුපියල් බිලියන 1.50ක් ක් බවට වාර්තා වූයේ 127%ක වර්ධනයක් සනිටුහන් කරමිනි. දේශීය හා අපනයන වෙළෙඳපොළවල භාවිතයට ගත හැකි නිෂ්පාදන අන්තර්ගත වූ මෙම අංශය හේලීස් සමූහයේ පැරණිම අංශ වලින් එකකි. විදේශ විනිමය මත ඇති පීඩනය අවම කරමින් දේශීය හා ගෝලීය වෙළෙඳපොළ සඳහා වන නිෂ්පාදන අගයෙන් 90% ක් අංශය විසින් දේශීයව එකතු කරනු ලැබේ. මීට අමතරව, මෙම අංශය සතුව ඇති ඉන්දීය කර්මාන්ත ශාලාව අංශයට අමුද්‍රව්‍ය මෙන්ම තොග ප්‍රමාණයන් ලබාගැනීමට සහාය වේ. අමුද්‍රව්‍ය සපයා ගැනීම අඛණ්ඩව අභියෝගයක් වන අතර එම අවදානම අවම කිරීම සඳහා අංශය විසින් අමුද්‍රව්‍ය සැපයුම් වෙනුවෙන් ආයෝජනය කර ඇත.

පාරිසරික ඉංජිනේරු විසඳුම් සඳහා පොල් කෙඳි ඇතුලත් නිෂ්පාදන බහුලව භාවිතා කරන නිසා මෙම අංශයට වඩාත් විශ්වාසනීය ඉදිරි දැක්මක් ඇති අතර මේ තුළින් ඉදිරි වර්ෂයන්හි ඉල්ලුම් ඉහළ යනු ඇතැයි ද අපේක්ෂා කරනු ලබයි.

## ඉදිකිරීම් ද්‍රව්‍ය

ඉදිකිරීම් ද්‍රව්‍ය අංශය පිළිවෙලින් 62% හා 37% ක ශක්තිමත් විකුණුම් ආදායම් වර්ධනයක් හා ලාභ වර්ධනයක් වාර්තා කර ඇති අතර වර්ෂය සඳහා රුපියල් බිලියන 1.15 ක ලාභයක් උපයා ඇත. ප්‍රමාණයන් හා වටිනාකම් පිළිවෙළින් 2.8 හා 3 ගුණාකාරවලින් වැඩි වීමත් සමඟ අපනයන ප්‍රමාණයේ වර්ධනය ඉතා දිරිගන්වන සුළු විය. මූලික නිස්සාරණයෙන් ඉවත්ව සරල ඉංජිනේරු විසඳුම් සමඟ අගය එකතු කළ නිෂ්පාදිත සඳහා අප නව කර්මාන්ත ශාලාවක් ආරම්භ කරන ලදී. තවදුරටත් සුළඟ, ජලය, ශබ්ද හා ගතික පීඩනයන්ට ඔරොත්තු දීමේ හැකියාව සහතික කරමින් ඇලුමෙක්ස් ගොඩනැගිලි පද්ධති, දොර ජනෙල් විසඳුම් සහ මුහුණත පද්ධති දේශීය හා ගෝලීය වෙළඳපොළ වලට හඳුන්වා දෙන ලදී. ගෝලීය ප්‍රමිතීන්ට හා පරීක්ෂණවලට අනුකූල බව තහවුරු කරමින් විදේශයන්හි උස් ගොඩනැගිලි සඳහාද මෙම නිෂ්පාදන භාවිතා කර ඇත. සිය අලෙවි නියෝජිත ජාලය පුළුල් කරමින් මෙම අංශය විසින් දේශීය වෙළෙඳපොළට අගය එකතු කළ නිෂ්පාදන පෙළක් හඳුන්වා දී ඇත. මෙම ක්‍රියාමාර්ග තුළින් අංශයට ඉහළ ධාරිතාවයකින් නිෂ්පාදනය කිරීමට ඉඩ සැලසෙන අතර පිරිවැය අවශෝෂණයද වැඩි දියුණු වේ. ඇලුමෙක්ස් විසින් දැව වලින් නිම වූ දොර ජනෙල් වලට වඩා අඩු ආකර්ෂණීය මිල ගණන් යටතේ දොර ජනෙල් නිෂ්පාදන පෙළක් සහිත Dwellings සන්නාමය දේශීය නිවාස වෙළෙඳපොළට හඳුන්වා දෙන ලදී. තවද දේශීය ඇලුමිනියම් ප්‍රතිචක්‍රීයකරණය සහ බිලට් නිෂ්පාදනය සැලකිය යුතු ලෙස ඉහළ ගිය අතර ආනයන ආදේශන හරහා විදේශ විනිමය ඉතිරි කර ගැනීමට හැකි විය.

ඇලුමෙක්ස් ගොඩනැගිලි පද්ධති දේශීය හා ගෝලීය වෙළඳපොළ තුළ අවධානය දිනාග ැනීමත් සමඟ මෙම අංශයේ ඉදිරි දැක්ම ඉතා විශ්වාසදායී වනු ඇති අතර එය අපනයන වර්ධනය ද ශක්තිමත් කරනු ඇත. නිෂ්පාදන ආකර්ෂණීය ලෙස මිල කර ඇති හෙයින් දේශීය වෙළඳපොළ තුළද වර්ධනය වීම සඳහා වැඩි ඉඩකඩක් මෙම අංශයට ඇත. වර්ෂය තුළ සිදුකරන ලද ධාරිතා ඉහළ දැමීම්, විකුණුම් ආදායමේ වර්ධනයට සහාය වන අතර ඵලදායිතාවය සහ කාර්යක්ෂමතාවයන් තුළින් ලාභදායීත්වයන් ඉහළ නැංවීමට අප අපේක්ෂා කරයි.

## රෙදිපිළි

2020/21 වර්ෂයේදී පවතින කර්මාන්තශාලාව තුළ උපරිම ධාරිතාවයට ළඟාවීමත් සමඟ 2021 අප්‍රේල් මාසයේදී සවුත් ඒෂියා ටෙක්ස්ටයිල්ස් ලිමිටඩ් අත්පත් කරගෙන හේලීස් ෆැබ්රික් පී එල් සී හි ඊළඟ වර්ධන අදියර වෙනුවෙන් යෝධ පියවරක් තබන ලදී. මෙය කාලෝචිත අත්පත් කර ගැනීමක් වන අතර ඊට නිවැරදි මුදල් ඒකකයෙන් මූල්‍යයනය කරන ලදී. නායකත්ව කණ්ඩායම් දැනට පවතින කර්මාන්ත ශාලාව සමඟ උපායමාර්ග, ප්‍රතිපත්ති හා ක්‍රියාවලීන් සමපාත කළ අතර, වාර්තා කරන කාලය තුළ රටෙහි විශාලතම රෙදිපිළි නිෂ්පාදකයා වීම සඳහා එහි මෙහෙයුම් වෙනසකට ලක් කරන ලදී. විකුණුම් රුපියල් බිලියන 31.67 ක් දක්වා 117% ක වර්ධනය වීම සහ මූල්‍ය කාර්ය සාධනයේ වර්ධනය, අත්පත් කරගත් ධාරිතාවය කාර්යක්ෂමව භාවිතයට ගැනීම මනාව පිළිඹිබු කරයි. හේලීස් ෆැබ්රික් සමූහය එහි දිගු කාලීන උපාය මාර්ගයන් අනුව ශක්තිමත්ව කටයුතු කර ඇති අතර පසුගිය වසර 03 ක් පුරා ලාභාංශ උපයා දී ඇත. ඉහළ වටිනාකමින් යුක්ත තම සන්නාමගත රෙදි නිෂ්පාදන කළඹ මත උපාය මාර්ගික හවුල්කරුවන් සමඟ කටයුතු කිරීමට නව කර්මාන්ත ශාලාවේ මෙහෙයුම් මෙම වසර තුළ වෙනස් කරන ලදී. වර්ෂය සඳහා ලාභය රුපියල් බිලියන 2.69 ක් වූ අතර එය පසුගිය වර්ෂයට සාපේක්ෂව 270% කින් වර්ධනය වී ඇත. එම ලාභය හේලීස් සමූහයේ සමස්ත ලාභයෙන් 10% ක් නියෝජනය කරයි.

හේලීස් ෆැබ්රික් සමූහය ක්ෂේත්‍රයේ නවෝත්පාදකයකු වන අතර ගෝලීය විලාසිතා සන්නාම සඳහා තමන් විසින් නිර්මාණය කළ නව රෙදිපිළි සපයා දුන් පළමු ශ්‍රී ලාංකේය සමාගම බවට පත්විය. එහි පර්යේෂණ හා සංවර්ධන කටයුතු වලදී අවසන් පාරිභෝගිකයින් සමඟ ද කටයුතු කර ඔවුන්ගේ අවශ්‍යතාද එකතු කරගැනීමට අප කටයුතු කර ඇත. සෑම වසරකම නව රෙදිපිළි කාණ්ඩ දෙකක් ඉදිරිපත් කරනු ලබන මෙම සමාගම ප්‍රධාන වශයෙන් ප්‍රවනතාවයක් සහිත ක්‍රීඩා කර්මාන්තය (Athleisure) වෙනුවෙන් පහසුකම් සපයනු ලබයි. ඒ තුළින් ශක්තිමත් හවුල්කාරිත්වයන් ගොඩනඟා ගැනීමට සහ වසරට අදාළ සියළු ඇණවුම් සම්පූර්ණ කර 1 වන මට්ටමේ ගැණුම්කරුවන්ගේ ආකර්ෂණය දිනා ගැනීමටද සමත්ව ඇත.

# සභාපති / ප්‍රධාන විධායකගේ පණිවිඩය

පාරිසරික, සමාජ හා පරිපාලන අරමුණු කෙරෙහි දැඩි අවධානයකින් කටයුතු කරන සමාගම රසායනික ද්‍රව්‍ය භාවිතය අවම කර ස්වභාවික ඩයි වර්ග භාවිතයෙන් නවෝත්පාදනයන් සිදුකර ඇත. නියාමන රාමුවෙන් ඔබ්බට යමින් පාරිසරික හානිය අවම කිරීම සඳහා අප කරමින් පවතින ජෛව විවිධත්වය හා පුනර්ජනන වැඩපිළිවෙල පරිසරය සුරක්ෂිත කිරීම සඳහා කැපවීමේ කොටසක් බවට පත්ව ඇත. ෆැබ්රික් සමූහයේ ශ්‍රම බලකායෙන් 85% ක් තම නිවසේ සිට කිලෝමීටර් 15 දුරක් ඇතුලත සේවයේ යොදවා ඇති නිසා සේවකයින්ට හා ප්‍රජාවට ඇති කැපවීම ඒ හා සමානව ශක්තිමත් වේ. ගුණාත්මකභාවය, පරිසරය සහ සමාජ අංශයන්හි අනුකූලතා සහතික මඟින් සමාගමේ කැපවීම වඩා තහවුරු වන අතර මෙම නවෝත්පාදන අංශයේ වර්ධන අපේක්ෂාවන් සඳහා ශක්තිමත් වේදිකාවක් සපයා ඇත.

**සංචාරක කටයුතු**

70% කට වැඩි රටවල් ප්‍රමාණයක් එන්නත් කළ සංචාරකයින් සඳහා දේශ සීමා විවෘත කිරීම නිසා 2021 නොවැම්බර් මස සිට 2022 මාර්තු මාසය දක්වා සංචාරක අංශය නැවත වේගයෙන් ප්‍රකෘතිමත් විය. ක්ෂේත්‍රයට වරින් වර බාධා එල්ලවීම හේතුවෙන් ප්‍රකෘති තත්වයට පත් වීමට අභියෝගයක් ඇති වූ අතර නැවත යථා තත්ත්වයට පත්වීමට තිරසාර වර්ධන වේගයක් අවශ්‍ය වේ. මාලදිවයිනේ ඇති අමායා කුඩාරා නිකේතනය නැවත මුදල් ඉපයීම අරඹා ඇති අතර අනෙකුත් ශ්‍රී ලාංකික නිකේතන ලාභ අලාභ නොලබන මට්ටමින් කළමනාකරණය කිරීමට සමත්ව ඇත. කිංග්ස්බරි සහ අමායා බීච් තවමත් අලාභ ලබමින් සිටියද අලාභ අඩු කරගැනීමට හැකි වී ඇත. සංචාරක කටයුතු වසර තුනක් තිස්සේ යහපත් වසරක් භුක්ති විඳ නොමැති හෙයින් එහි ප්‍රබෝධය ඇති කරගැනීමට කටයුතු කළ යුතු වේ. විදේශ විනිමය රට තුළට ගලා ඒමට මෙම ක්ෂේත්‍රයේ දායකත්වය අති මහත්ය. එබැවින් මෙම අංශයේ තිරසාර පිබිදීමක් සඳහා වැඩපිළිවෙලක් නිර්මාණය කිරීම අත්‍යවශ්‍ය කරුණකි. ක්ෂේත්‍රයේ පුනරුදයට ආර්ථික හා දේශපාලන ස්ථාවරත්වය අත්‍යවශ්‍ය වන අතර ඉදිරි වසර තුළ අප බලාපොරොත්තු සහගත කාලයක් අපේක්ෂා කරමු.

**වෙනත්**

මෙම අංශයට ආයෝජන කටයුතු, සමූහයේ සේවා කටයුතු, බී පී ඕ මෙහෙයුම් (BPO) සහ ෆෙන්ටන්ස් සමූහයේ මෙහෙයුම් අයත් වේ. පුළුල් වූ ෆෙන්ටන්ස් හි මෙහෙයුම් හා හේලීස් පී එල් සී වෙත ලද ලාභාංශවලින් මෙම අංශයේ වර්ෂය සඳහා ලාභය 165% කින් වර්ධනය වී රුපියල් බිලියන 4.49 ක් ලෙස වාර්තා කර ඇති අතර එය සමූහයේ සමස්ත ලාභයෙන් 16% කි. වසර 103 ක් පමණ පැරණි ෆෙන්ටන්ස් සමූහය විද්‍යුත් යාන්ත්‍රික, වායු සමීකරණ, ජලනල, ගිනි ආරක්ෂාව, විද්‍යුත් කටයුතු, පහසුකම් කළමනාකරණ සහ සූර්ය බලශක්තිය ඇතුළු සියළු ව්‍යාපාර ක්ෂේත්‍රයන්හි මෙහෙයුම් කටයුතු ව්‍යාප්ත කිරීම නිසා මෙම වර්ෂයේදී අතිවිශිෂ්ඨ වර්ධනයක් අත්පත් කරගෙන ඇත. වර්ෂය තුළ විදුලි ඇනහිටීම් බහුලව සිදුවීම නිසා සූර්ය බලශක්තිය සඳහා වැඩි උනන්දුවක් ඇතිවී ඇති අතර මේ වන විට එය විශාලතම ව්‍යාපාර කටයුත්ත බවට පත්ව ඇත. මෙම අංශය විසින් මේ වන විට විශාල ව්‍යාපෘති වෙනුවෙන් වන සැපයුම් සඳහා ප්‍රධාන මෙහෙයුම්කරුවන් අත්පත් කරගෙන ඇත. ෆෙන්ටන්ස් සිය තොරතුරු තාක්ෂණ ව්‍යාපාරය 100% වඩා වර්ධනය කර ක්ෂේත්‍රයේ ඉහළම සමාගම් 03 අතරටද පැමිණ ඇත.

මව් සමාගමට ලැබුණු රුපියල් බිලියන 5.15 ක ලාභාංශ ගිණුම් ඒකාබද්ධකරණයේදී ඉවත් වී ඇත. ඉදිකිරීම් අංශයේ මන්දගාමීත්වය, විදේශ විනිමය ද්‍රවශීලතාවය සහ ඉහළ පොළී අනුපාත වැනි තත්ත්වයන් වලින් ව්‍යාපාර කටයුතු අභියෝගාත්මක වුවද ව්‍යාපාරයේ අනාගත ඇණවුම් විශ්ලේෂණය කිරීම තුළින් අංශයේ ඉදිරි දැක්ම බලාපොරොත්තු සහගත වනු ඇත.

**ශ්‍රම බලය**

අපගේ උපාය මාර්ගික අරමුණු සාක්ෂාත් කරගැනීම සහතික කරමින් හේලීස් ලෝකයෙහි සෑම කටයුත්තක්ම ඉතා හොඳින් සිදු කරනු ලබන්නේ අපගේ ශ්‍රම බලකාය විසිනි. එම හේතුව නිසා වසංගත කාල සීමාව තුළ වැටුප් ගෙවීමට බලපෑමක් නොවීම සහතික කිරීම සඳහා අප මුල සිටම අවශ්‍ය සැලසුම් සකස් කල අතර, පවතින අර්බුදකාරී තත්ත්වයෙන් දැඩි ලෙස පීඩාවට පත් වුවන්ට සහන සැලසීමට ක්‍රමයක් සොයා ගත්තේද ඒ නිසාවෙනි. පසුගිය වසරේ සහ මෙම වසරේ ඉහළ වර්ධන තත්ත්වයක් තහවුරු කර ඇති නිසා අපගේ තීරණ සාධාරණීකරණය වී ඇත. සංවිධානය තුළ පවතින කුසලතා සංස්කෘතිය මඟින් අභ්‍යන්තර ව්‍යවසායකත්වය මෙන්ම සමූහය තුළ අදහස් ප්‍රකාශ කිරීම දිරිගැන්වීම තුලින් යටිතල පහසුකම්, ව්‍යාපාර ක්‍රියාවලි සහ දැනුම වර්ධනය කිරීමට පසුබිම සකස් කරනු ලබයි.

සමාන අවස්ථා, විවිධත්වය, අන්තර්ගතය යන සාධකයන් හේලීස්හි ප්‍රතිපත්ති රාමුව තුළට ඒකාබද්ධ කර ඇති අතර අප මේවා ගැඹුරට අධ්‍යයනය කරන විට එහි සීමාවන් පිළිබඳ අපගේ දැනුවත්භාවය ක්‍රමයෙන් ඉහළ යනු ලබයි. ස්ත්‍රී පුරුෂ සමානාත්මතාවය අප විසින් අවධානය යොමු කළ යුතු වැදගත් ක්ෂේත්‍රයක් වන අතර ස්ත්‍රීන් සඳහා නව අවස්ථා නිර්මාණය කිරීමට අප අවධානය යොමු කර ඇත. හේලීස් ෆැබ්රික් සමූහය විසින් සම්පූර්ණ ස්ත්‍රී කණ්ඩායමක් සමඟ ගෙතුම් කම්හලක් ආරම්භ කළ අතර එය ඉතා සාර්ථක වී ඇත. එසේම ඇඩ්වාන්ටිස් ආයතනයේ කාන්තාවන්ට ෆෝක්ලිෆ්ට් ක්‍රියා කරවීමට පුහුණු කර ඇති අතර ඔවුන්ගේ හැකියාවන් හා කුසලතා ඔප්පු කිරීමට ඒ තුළින් මඟ පාදයි. වතු සමාගම් අංශයද කාන්තාවන්ට කාංකානි වෘත්තිය වෙත යාමට දිරි ගන්වා ඇත. ශ්‍රම බලකායේ ස්ත්‍රී සහභාගීත්වය ඉහළ යෑම සඳහා අවස්ථා තිබිය යුතු අතර අප පැමිණි ගමනේ මඟ හැරුණු දේ යළි සකස් කිරීමට අප උනන්දු වෙමු. එමෙන්ම අපගේ සමාන අවස්ථා ප්‍රතිපත්තියට අනුව නායකත්වය සඳහා කාන්තා නියෝජනය වැඩි කිරීමටද අප කැපවී සිටිමු. ප්‍රධාන අධ්‍යක්ෂ මණ්ඩලයට හා පරිපාලිත සමාගම්වල අධ්‍යක්ෂ මණ්ඩල සඳහා කාන්තාවන් පත් කිරීම මේ සඳහා සාක්ෂියකි. තවත් බොහෝ දේ කළ යුතුව ඇත, ඒ සඳහා අප පළමු පියවර තබා ඇති අතර මෙම ශක්තිමත් පදනම් අඛණ්ඩව පවත්වා ගෙන යාමට අප පොරොන්දු වෙමු.

**ඉදිරි දැක්ම**

2021 වර්ෂයේ ඇස්තමේන්තු කළ 6.1% ට සාපේක්ෂව 2022 හා 2023 වර්ෂ දෙක සඳහා 3.6% ක ආර්ථික වර්ධනයක් පුරෝකථනය කර ඇත. එසේම ආහාර සහ ඉන්ධන මිල ගණන්ද ඉහළ යනු ඇතැයි අපේක්ෂා කරයි. මෙය අඩු ආදායම්ලාභී රටවල්වලට වඩාත්ම බලපානු ඇතැයි අපේක්ෂා කරන අතර ඉන් ඇති කරන බලපෑම අවම කිරීම සඳහා බහු පාර්ශවීය මැදිහත් වීමක් අවශ්‍ය වේ. 2021 වර්ෂයේ ඇස්තමේන්තු කළ 10% ක ගෝලීය වෙළඳාමේ වර්ධන අනුපාතයට සාපේක්ෂව 2022 වර්ෂයේදී වර්ධනය 5%ක් වැනි මධ්‍යස්ථ අගයක් ගනු ඇතැයි අපේක්ෂා කරන අතර එය අයහපත් තත්ත්වයක් ලෙස පෙන්වා දිය හැකිය.

වර්තමානයේ රටේ පවතින ආර්ථික අස්ථාවරත්වය විසඳීම උදෙසා ජාත්‍යන්තර මූල්‍ය අරමුදල හා අනෙකුත් පරිත්‍යාගශීලී රටවල් සමඟ සාකච්ඡා සිදුවෙමින් පවතී. ඉහළ ණය, අඩු විදේශ විනිමය සංචිතය හා ඉහළ උද්ධමනය වැනි සාර්ව ආර්ථික අභියෝග නිසා සිදුවන බලපෑම හේතුවෙන් ආසියානු සංවර්ධන බැංකුව මඟින් ශ්‍රී ලංකාවේ ආර්ථික වර්ධනය 2.4% ක් ලෙස පුරෝකථනය කර ඇත. ආහාර, ඉන්ධන, සහ අනෙකුත් අත්‍යවශ්‍ය ද්‍රව්‍යවල සැපයුම් හිඟය සහ විදේශ විනිමය ද්‍රවශීලතාවය සීමා කිරීම නිසා 2022 වර්ෂයේදී තවදුරටත් උද්ධමනය ඉහළ යනු ඇතැයි අපේක්ෂා කරයි. කෙසේ වෙතත් ගෝලීය මිල ගණන්වල අඩුවීම සහ සැපයුම්වල ස්ථාවරත්වය සමඟ උද්ධමන පීඩනය සැහැල්ලු වීම මත 2023

**සමාන අවස්ථා, විවිධත්වය, අන්තර්ගතය යන සාධකයන් හේලිස්හි ප්‍රතිපත්ති රාමුව තුළට ඒකාබද්ධ කර ඇති අතර අප මේවා ගැඹුරට අධ්‍යයනය කරන විට එහි සීමාවන් පිළිබඳ අපගේ දැනුවත්භාවය ක්‍රමයෙන් ඉහළ යනු ලබයි. ස්ත්‍රී පුරුෂ සමානාත්මතාවය අප විසින් අවධානය යොමු කළ යුතු වැදගත් ක්ෂේත්‍රයක් වන අතර ස්ත්‍රීන් සඳහා නව අවස්ථා නිර්මාණය කිරීමට අප අවධානය යොමු කර ඇත.**

වර්ෂයේ තත්ත්වය තරමක් මධ්‍යස්ථ වනු ඇතැයි සිතිය හැකිය. ආර්ථික වර්ධනය සඳහා ප්‍රතිපත්ති නිර්මාණය කිරීමේදී සාර්ව ආර්ථික ස්ථායීතාවය යථා තත්ත්වයට පත් කිරීම සඳහා ක්ෂණික පියවරයන් අත්‍යවශ්‍ය වේ. පැහැදිලි ඉදිරි ගමනක් ඇති වන තෙක් ඉදිරි මාස 3 ඉතා දුෂ්කර වනු ඇති අතර මූල්‍ය වර්ෂයේ දෙවන අර්ධයේ අවශ්‍ය ව්‍යුහාත්මක ප්‍රතිසංස්කරණ ආරම්භ කිරීමත් සමඟ විසඳුම් ඉදිරිපත් වනු ඇතැයි අප ධනාත්මකව අපේක්ෂා කරන්නෙමු.

ඉහත එක් එක් ව්‍යාපාරික අංශයන් යටතේ හේලීස් සමූහයේ සැලසුම් අප සාකච්ඡා කර ඇති අතර අපනයන වර්ධනය සඳහා රටේ අවශ්‍යතාවය සමඟ එම සැලසුම් සමපාත වේ. අපගේ ශක්තිමත් ආයතනික පාලන යන්ත්‍රණයන් ඉදිරි අභියෝග ජයගැනීමට මූලික වන අතර පසුගිය වසර තුනේ ඇතිවූ පීඩාකාරී තත්වයෙන් පසු අපගේ සාමූහික අවබෝධය ඉහළ ගොස් ඇත. හේලීස් ලෝකය සඳහා නව මායිම් නිර්ණය කිරීමේදී ශක්තිමත් සන්නිවේදන මාර්ග හා දක්ෂ කණ්ඩායම් අපගේ අභිලාෂයන්ට සහාය විය.

## කොටස් හිමියන්ට වටිනාකම

2021/22 මූල්‍ය වර්ෂය සඳහා කොටස් හිමියන්ට 26% ප්‍රාග්ධන ලාභයක් හිමිකරමින් හේලීස් පී එල් සී හි කොටසක මිල රුපියල් 60.80 සිට රුපියල් 76.90 දක්වා ඉහළ ගොස් ඇත.


වර්ෂය තුළදී කොටස් හිමියන් සඳහා වන වටිනාකම සැලකිය යුතු ලෙස ඉහළ නංවමින් කොටසක ඉපයුම රුපියල් 10.80 සිට රුපියල් 24.34 දක්වා 125% කින් වර්ධනය වී ඇත. 2022 මාර්තු මාසයේදී රුපියල් 4.00 ක අතුරු ලාභාංශයක් ද අප විසින් බෙදාහරින ලදී.

හේලීස් පී එල් සී වෙත ලබා දී ඇති ණය ශ්‍රේණිගත කිරීම වර්ෂය තුළදී දෙවරක් ඉහළට සංශෝධනය කර ඇති අතර හේලීස් සමූහයේ කාර්ය සාධනය හා දරාගැනීමේ හැකියාව පිළිඹිබු කරමින් ස්ථාවර දැක්මක් සහිත '- ශ්‍රේණිය හිමිකරගෙන ඇත.

## අගය කිරීම්

විවිධ අංශ පුරා සිටින කණ්ඩායම් වල සියළු දෙනාගේ වෙහෙස මහන්සි වී වැඩ කිරීමේ හා කැපවීමේ ප්‍රතිඵලයක් ලෙස වාර්ෂික වාර්තාවේ දක්වා ඇති පරිදි සුවිශේෂ කාර්යසාධනයක් තුළින් අපගේ පාර්ශවකරුවන්ට වටිනාකම් නිර්මාණය කිරීමට අපට හැකි වී ඇත. හේලීස් සමූහයේ වටිනාකම් සමඟ ජීවත් වෙමින් රට තුළ වඩාත් පිළිගත් සමාගමක් බවට හේලීස් සමාගම පත්කිරීම පිළිබඳ සියළු දෙනාට ස්තුති කිරීම සඳහා අධ්‍යක්ෂ මණ්ඩලය ද මා සමඟ එක් වේ. නව මට්ටමකින් දක්ෂතා ප්‍රදර්ශනය කිරීම සඳහා සේවකයින් දිරිගන්වමින් හා ඔවුන් පුහුණු කරමින් ඉදිරියෙන් සිට කණ්ඩායම් මෙහෙයවූ හේලීස් සමූහ කළමනාකරණ කමිටුවට හා අංශ ප්‍රධානීන්ට ස්තුති කිරීමට මා මෙය අවස්ථාවක් කර ගනිමි.

නව දැක්මක් සහ උපදෙස් සමඟින් වර්ෂය තුළදී කැපී පෙනෙන කාර්යය සාධනය සඳහා දායක වූ සම සභාපතිවරයාට මා ස්තුතිවන්ත වෙමි. එසේම දුෂ්කර වර්ෂයක අප හට මෙසේ කටයුතු කිරීමට හේතු වූ සුපරික්ෂාකාරීත්වය සහ තීක්ෂණ බුද්ධිය වෙනුවෙන් මම මාගේ සෙසු අධ්‍යක්ෂ මණ්ඩල සාමාජිකයින්ට ස්තුතිවන්ත වෙමි. මෙම සුවිශේෂී ගමනට අප සමඟ එක් වූ අපගේ කොටස් හිමියන්ගේ හා අනෙකුත් පාර්ශවකරුවන්ගේ විශ්වාසය හා පැහැදීමද අප අගය කර සිටිමු.



**මොහාන් පණ්ඩිතගේ**
සභාපති සහ ප්‍රධාන විධායක
2022 මැයි මස 19